SRI LANKA

# Level 1

# මූල්‍ය ගිණුම්කරණය
# Financial Accounting

# T - 01

## මූල්‍ය ගිණුම්කරණ සහ වාර්තාකරණ විෂය පථය
## AA11 – මූල්‍ය ගිණුම්කරණ මූලිකයන් (FAB) - ප්‍රධාන ඉගෙනුම් ප්‍රතිඵල

| ඒකකය | ඉගෙනුම් ප්‍රතිඵල | විෂය නිර්දේශ බර තැබීම % |
|---|---|---|
| 01 | ගණුම්කරණයේ හැඳින්වීම | 05 |
| 02 | ගිණුම්කරණ සමීකරණ, ද්විත්ව සටහන් ක්‍රමය සහ ගිණුම්කරණ සංකල්ප | 25 |
| 03 | මූලික සටහන් පොත්, පාලන ගිණුම් සහ ශේෂ පිරික්සුම | 27 |
| 04 | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම | 30 |
| 05 | බැංකු සැසඳුම් ප්‍රකාශන | 08 |
| 06 | පරිගණකගත පරිසරය සහ සදාචාරාත්මක වීමේ වැදගත්කම | 05 |

# ගිණුම්කරණය හැඳින්වීම
# Introduction to Accounting

## ගිණුම්කරණය නිර්වචනය
## Definitions of Accounting

| ඇමරිකානු ගිණුම්කරණ සංගමය<br>American Accounting Association |
|---|
| තොරතුරු භාවිතා කරන පාර්ශ්වයන්ට බුද්ධිමත් විනිශ්වයක් සහ තීරණයක් ගැනීමට හැකි වන පරිදි ආර්ථික තොරතුරු හඳුනා ගැනීම, මැනීම හා ඉදිරිපත් කිරීම ගිණුම්කරණයයි. |
| Accounting is the process of identifying, measuring and communication economic information to permit informed, judgements and decisions by users of the information. |

| ඇමරිකානු සහතිකලත් පොදු ගණකාධිකාරීන්ගේ සංගමය<br>(American Institute of Certified Public Accountants) |
|---|
| යටත් පිරිසෙයින් අර්ධ වශයෙන්වත් මූල්‍යමය ස්වභාවයක් ගන්නා ගනුදෙනු හා සිද්ධීන් කිසියම් සුවිශේෂී ආකාරයකට මූල්‍යමය අගයන්ගෙන් සටහන් කිරීම, වර්ග කිරීම, සාරාංශ කිරීම සහ එහි ප්‍රතිඵල අර්ථකථනය කිරීම පිළිබඳ කලාව ගිණුම්කරණය යි. |
| The art of recording, classifying and summarizing in a significant manner and in terms of money, transactions and events, which are, in part at least, of a financial character and interpreting the results thereof. |

ඉහත නිර්වචනයන් සැලකිල්ලට ගෙන ගිණුම්කරණය යන්න පහත ලෙස නිර්වචනය කළ හැකිය.

**"කිසියම් ගිණුම්කරණ ඒකකයක් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ආර්ථික තොරතුරු සැපයීමේ සමස්ත ක්‍රියාවලිය"** ගිණුම්කරණය නම් වේ.

### ගිණුම්කරණයේ මූලික අරමුණ / මූල්‍ය ගිණුම්කරණයේ මූලික අරමුණ

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

ගිණුම්කරණයේ වෙනත් අරමුණු

- ක්‍රමවත් අයුරින් වාර්තා තබා ගැනීම සඳහා
- ව්‍යාපාරයට අදාළ මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා
- ව්‍යාපාරයට අදාළ මූල්‍යමය තත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා
- ව්‍යාපාරයේ ද්‍රවශීලතා මට්ටම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා
- නීතිමය අවශ්‍යතා සපුරාලීම සඳහා

## ගිණුම්කරණ තොරතුරු කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන්

| ගිණුම්කරණ තොරතුරු භාවිතා කරන පාර්ශ්වය | තොරතුරු වල අවශ්‍යතාවය |
|---|---|
| 1. හිමිකරුවන් / අයිතිකරුවන් / කොටස්හිමියන් | ..................................................<br>..................................................<br>..................................................<br>..................................................<br>.................................................. |
| 2. කළමනාකරුවන් | ..................................................<br>..................................................<br>.................................................. |
| 3. ණයහිමියන් | සපයා ඇති ණය හා ඊට අදාළ පොළී ආපසු අය කර ගැනීමේ හැකියාව දැන ගැනීම.<br>තවදුරටත් ණය මුදල් සැපයීම සුදුසු ද යන්න තීරණය කිරීම.<br>ණය සඳහා ඇප තැබූ වත්කම් වල සුරක්ෂිතබව දැන ගැනීම. |
| 4. සේවකයින් හා වෘත්තීය සමිති | ව්‍යාපාරයේ ස්ථාවරත්වය හා ඒ මත රැකියාවේ සුරක්ෂිතබව දැන ගැනිම.<br>වැටුප් හා දීමනා ගෙවීමේ හැකියාව දැන ගැනීම.<br>වැටුප් හා දීමනා වැඩි කර ගැනීමට ඇති හැකියාව දැන ගැනීම. |

| | | |
|---|---|---|
| 5. | රජයේ විවිධ ආයතන | රජයට අයවිය යුතු බදු නිසි පරිදි අය කර ගැනීම. (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව)<br>ආර්ථික තොරතුරු විශ්ලේෂණය හා වගුගත කිරීම. (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව) |
| 6. | ගනුදෙනුකරුවන් / පාරිභෝගිකයන් | සාධාරණ මිලකට  භාණ්ඩ ලබා ගත හැකි ද යන්න තීරණය කිරීම.<br>ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කර ගැනීම තුළින් භාණ්ඩ හා සේවා අඛණ්ඩව ලබා ගැනීමේ හැකියාව දැන ගැනීම.<br>ප්‍රතිඥාභාර වගකීම් ඉටු කිරීමේ හැකියාව දැන ගැනීම. |
| 7. | තරගකරුවන් | ..........................................<br>..........................................<br>..........................................<br>.......................................... |
| 8. | ආයෝජකයින් | විකල්ප ආයෝජන මාර්ග හඳුනා ගැනීම.<br>වඩාත් ලාභදායී ආයෝජන ඉඩ ප්‍රස්තා හඳුනා ගැනීම.<br>ආයෝජනයන්හි අවදානම දැන ගැනීම. |

## අභ්‍යාසය 01

01. පහත සඳහන් ඒවා අතුරෙන්, අස්තිත්වයක ඇල්මැති පාර්ශ්වයක් (stakeholder) වන්නේ කවුරුන් ද?

(1) සේවකයන් (2) රජය
(3) කළමනාකරුවන් (4) ඉහත සඳහන් සියල්ල ම

**(AAT - July 2020)**

02. පහත සඳහන් ඒවා අතුරෙන් මූල්‍ය ප්‍රකාශන භාවිත කරනු ලබන පාර්ශ්වයන් වන්නේ,

(1) අයිතිකරුවන් ය (2) සේවකයන් ය
(3) ආයෝජකයන් ය (4) ඉහත සඳහන් සියල්ලෝ ම ය

**(AAT - January 2020)**

03. පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයක් වන්නේ,

(1) අයිතිකරුවන් (2) රජය
(3) ණයහිමියන් (4) ඉහත සඳහන් සියල්ලෝම

**(AAT - July 2018)**

04. මූල්‍ය ගිණුම්කරණයේ අරමුණු දෙකක් (02) සඳහන් කරන්න. **(AAT - July 2018)**

05. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ප්‍රධානම අරමුණ වන්නේ,

(1) නිෂ්පාදිතයක විකුණුම් මිල තීරණය කිරීමයි
(2) ආර්ථික තීරණ ගැනීමේ දී ප්‍රයෝජනවත් වන අස්තිත්වයක මූල්‍ය තොරතුරු ඒවා භාවිත කරන්නන්ට (පරිශීලයක්ට) සැපයීමයි
(3) වංචා සහ වැරදි වැළැක්වීමය
(4) ආයතනයේ සේවකයින් ආරක්ෂා කිරීමයි **(AAT - January 2018)**

06. මූල්‍ය තොරතුරු භාවිත කරන්නන් දෙදෙනෙකු (02) සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

**(AAT - July 2017)**

07. පහත සඳහන් ඒවා අතුරෙන්, අස්තිත්වය මූල්‍ය තොරතුරු භාවිත කිරීමෙන් ණයහිමියෙකුට ඇති ප්‍රයෝජනයක් වන්නේ කුමක්ද?

(1) ආයෝජන මත ප්‍රතිලාභය පිළිබඳ දැනගැනීම
(2) ණය ලබාදීමට පෙර මූල්‍ය ස්ථාවරභාවය පිළිබඳව දැනගැනීම
(3) බදුකරණ අරමුණු සඳහා ඉපැයීම් පිළිබඳව දැනගැනීම
(4) වේතන වැඩිකිරීම්, ප්‍රසාද දීමනා සහ වඩා හොඳ වැඩ කිරීමේ තත්ත්වයන් අපේක්ෂා කිරීම. **(AAT - January 2017)**

08. ගිණුම්කරණයේ අරමුණක් වන්නේ,

(1) ව්‍යාපාරයේ ස්වභාවය අවබෝධ කර ගැනීම යි
(2) නිෂ්පාදිතයක විකුණුම් මිල තීරණය කිරීම යි
(3) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය අවබෝධ කර ගැනීම යි
(4) අභ්‍යන්තර පාලන පද්ධතියේ දුර්වලතා හඳුනා ගැනීම යි **(AAT - July 2019)**

# ගිණුම්කරණ තොරතුරු

තොරතුරු

| මූල්‍ය තොරතුරු | මූල්‍ය නොවන තොරතුරු |
|---|---|

ගිණුම්කරණ නිර්වචනය තුළ සඳහන් ආර්ථික තොරතුරු යන්නෙන් අදහස් කරන්නේ මූල්‍යමය තොරතුරු ය.

නිදසුන්:

.............................................................................................................................................

.............................................................................................................................................

ව්‍යාපාර ඒකකයක් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා වැදගත් වන මූල්‍යමය නොවන තොරතුරු ද පවතී.

නිදසුන්:

.............................................................................................................................................

.............................................................................................................................................

ගිණුම්කරණයේ දී ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ මූල්‍යමය තොරතුරු වන අතර, එහෙත් මූල්‍යමය නොවන තොරතුරු ද තීරණ ගැනීම සම්බන්ධයෙන් වැදගත් වේ.

## ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ
## Qualitative Characteristics of Accounting Information

පොදු අරමුණු සඳහා ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශ මගින් තීරණ ගන්නා පාර්ශවයන්ට අවශ්‍ය තොරතුරු නිවැරදි ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු ය. මෙකී මූල්‍ය තොරතුරුවල ප්‍රයෝජනවත් භාවය පැවතීමට නම් ඒවා අදාල සහ විශ්වාසනීයව ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශ වල ප්‍රයෝජනවත්භාවය වැඩි වීමට නම් ඒවා සන්සන්දනාත්මක, තහවුරු කළ හැකි, යාවත්කාලීන හා තේරුම් ගැනීමට පහසු විය යුතුය.

මූල්‍ය තොරතුරු සතු විය යුතු ගුණාත්මක ලක්ෂණ ප්‍රධාන ආකාර 2 කි.

1. ..........................................................................................................................................

(Fundamental Qualitative Characteristics)

2. ..........................................................................................................................................

(Enhancing Qualitative Characteristics)

# මූලික ගුණාත්මක ලක්‍ෂණයන්

අදාලත්වය හා විශ්වාසනීයත්වය ගිණුම් ප්‍රකාශවල තිබිය යුතු මූලික ගුණාත්මක ලක්‍ෂණයන් වේ.

**1.** ..........................................................................................................................................
**(Relevance)**

ගිණුම්කරණ තොරතුරු භාවිතා කරන්නන් විසින් ගනු ලබන තීරණ වෙනස් කිරීමට අදාළත්වයෙන් යුතු මූල්‍ය තොරතුරු වලට හැකියාවක් පවතී. පහත සඳහන් ලක්ෂණයන්ගෙන් යුතු නම් මූල්‍ය තොරතුරු මත තීරණ ගැනීමේ හැකියාවක් පවතී.

1. **පුරෝකථනය කළ හැකි බවින් යුතු වීම (Predictive Value)** - අනාගත ප්‍රතිඵල පුරෝකථනය කිරීමේදී මූල්‍ය තොරතුරු ප්‍රයෝජනයට ගත හැකිය.
2. **තහවුරු කළ හැකි බවින් යුතු වීම (Confirmatory Value)** - මූල්‍ය තොරතුරු මගින් මීට පෙර සිදු කරන ලද ඇගයීම් සඳහා ප්‍රතිචාර ලබාදීම.

✦ **ප්‍රමාණාත්මක භාවය (Materiality)**

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

**2.** .......................................................................................................... **(Faithful Representation)**

ගිණුම්කරණ තොරතුරුවල ප්‍රයෝජනවත්භාවය ආරක්‍ෂා කිරීම සඳහා ඒවා විශ්වාසදායී ලෙස ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ගිණුම්කරණ තොරතුරු විශ්වාසදායී ආකාරයෙන් ඉදිරිපත් කිරීම සඳහා පහත ලක්ෂණ තුන සම්පූර්ණ වීම අවශ්‍ය වේ.

**(a)** .......................................................................................................... **(Complete)**

ඉදිරිපත් කරන්නා වූ තොරතුරුවල තේරුම් ගැනීම සඳහා අවශ්‍ය සියලුම විස්තර කිරීම් අඩංගු විය යුතුය.

උදාහරණ :- වත්කම් කාණ්ඩයක් (asset group) පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදී,

1) එම කාණ්ඩයේ වත්කම්වල ස්වභාවය පිළිබඳ විස්තරයක්
2) එම කාණ්ඩයට අයත් සියලුම වත්කම්වල ගණිතමය අගයන්
3) එම ගණිතමය වටිනාකම්වලට අදාල විස්තරයන්

ආදිය ඉදිරිපත් කළ යුතු ය.

**(b)** ...................................................................................................................... **(Neutral)**

මූල්‍ය තොරතුරු තෝරාගැනීම සඳහා ඉදිරිපත් කිරීම අපක්ෂපාතීව සිදු කළ යුතු ය.

**(c)** ...................................................................................................................... **(Free from Error)**

ඉදිරිපත් කරන තොරතුරු මඟහැරීම්වලින් තොර නිවැරදි ඒවා විය යුතු ය.

## ගුණාත්මක ලක්ෂණ වැඩි දියුණු කරණ ලක්ෂණයන්

සන්සන්දනාත්මක බව, තහවුරු කිරීමේ හැකියාව, යාවත්කාලීන හා තේරුම්ගත හැකි බව ආදී ලක්ෂණ අදාල හා විශ්වාසදායී අයුරින් ඉදිරිපත් කරන ගිණුම්කරණ තොරතුරුවල ප්‍රයෝජනවත් භාවය වැඩිදියුණු කරනු ලැබේ.

**1. සන්සන්දනාත්මක බව (Comparability)**

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

එම තොරතුරු මගින් ආයතනයේ මූල්‍ය තත්වය හා කාර්ය සාධනය පිළිබඳ උපනති හඳුනාගත හැකි විය යුතු ය.

**2.** ...................................................................................................................... **(Verifiability)**

ඉදිරිපත් කරන්නා වූ තොරතුරුවල විශ්වාසදායී බව ආරක්ෂා කිරීම සඳහා ඒවා තහවුරු කිරීමේ හැකියාවෙන් යුක්ත වීම අවශ්‍ය වේ. තහවුරු කළ හැකි බව යන්නෙන් අදහස් වන්නේ විවිධ දැනුම් මට්ටම් වලින් යුක්ත ස්වාධීන පුද්ගලයන්ට පූර්ණ වශයෙන් ම සම්මුතියකට එළඹීමට නොහැකි වූවත්, යම්තාක් දුරකට හෝ තහවුරු කළ හැකි බවින් යුක්ත විය යුතු බවයි.

**3. යාවත්කාලීන බව (Timeliness)**

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

**4. ........................................................................................................ (Understandability)**

පැහැදිලිව සහ කෙටියෙන් තොරතුරු වර්ගීකරණය කොට ඉදිරිපත් කිරීම තුළින් ඒවායේ තේරුම්ගත හැකි බව වැඩිදියුණු කෙරේ. එසේම ඇතැම් ආවේණික සංකීර්ණ තොරතුරු, එම සංකීර්ණභාවය හේතුකොටගෙන මූල්‍ය ප්‍රකාශවලින් ඉවත් කළහොත්, එය ද මූල්‍ය ප්‍රකාශ පරිශීලකයන් නොමග යැවීමක් ලෙස සැළකෙන අතර, එවැනි මූල්‍ය ප්‍රකාශ අසම්පූර්ණ ඒවා වේ. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන්නේ ව්‍යාපාරික සහ ආර්ථික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සැළකිය යුතු දැනුමක් සහ ප්‍රවේශමෙන් එම තොරතුරු විශ්ලේෂණය කරන පරිශීලකයන් සඳහා බැවින් ඒවා සම්පූර්ණ නමුත් තේරුම්ගත හැකි අයුරින් ඉදිරිපත් කළ යුතු ය.

## අභ්‍යාසය 02

01. පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය තෝරන්න.
    (1) අදාළ බව යනු මූල්‍ය තොරතුරක මූලික ගුණාත්මක ලක්ෂණයකි
    (2) ගනුදෙනු, ගිණුම්කරණ නිමැවුමක් ලෙස සැලකේ
    (3) ගිණුම්කරණයේ ප්‍රධානත ම අරමුණ වන්නේ, සංවිධානයේ සේවකයන්ව ආරක්ෂා කිරීමයි
    (4) මූල්‍ය තොරතුරුවල කිසිදු සීමාවක් නොමැත **(AAT - July 2020)**

02. පහත සඳහන් ඒවා අතුරෙන්, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පමය ආකෘති රාමුව අනුව මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණයක් වන්නේ කුමක්ද?
    (1) උපචිත පදනම (2) අදාල බව
    (3) අඛණ්ඩ පැවැත්ම (4) ඓතිහාසික පිරිවැය
    **(AAT - July 2017)**

03. පොදු අරමුණු සඳහා වූ මූල්‍ය ප්‍රකාශන (General Purpose Financial Statements) වල ගුණාත්මක ලක්ෂණ දෙකක් (02) සඳහන් කරන්න. **(AAT - July 2015)**

04. මූල්‍ය ප්‍රකාශවල ගුණාත්මක ලක්ෂණයක් (qualitative characteristic) නොවන්නේ පහත ඒවා අතුරෙන් කුමන එකද?
    (1) අවබෝධ කර ගත හැකි බව. (2) අඛණ්ඩ පැවැත්ම (Going Concern)
    (3) විශ්වසනීය බව. (4) අදාල බව (Relevance)
    **(AAT - July 2012)**

05. "සීමාසහිත ස්ටාර්බක්ස් සමාගම විසින් එහි ව්‍යාපාර කටයුතු ආරම්භ කළ අවස්ථාවේ සිට වත්කම් ක්ෂය කිරීම සඳහා සරළ මාර්ග ක්‍රමය (Straight line method) භාවිත කරන ලදී."
    ඉහත ප්‍රකාශයෙන් ඉතා හොඳින් විස්තර වන්නේ පහත දැක්වෙන කුමන ලක්ෂණයද?
    (1) සත්‍යාපනය කළ හැකියාව (Verifiability) (2) සංසන්දනාත්මක බව (Comparability)
    (3) සංගතභාවය (Consistency) (4) කාලච්ඡේද (Periodicity) සංකල්පය
    **(AAT - June 2009)**

# ගිණුම්කරණ ඒකකය
## Accounting Entity

ගිණුම්කරණ කටයුතු සිදු කිරීම සඳහා පදනම් කරගනු ලබන ඒකකය ගිණුම්කරණ ඒකකයක් නම් වේ.

1. පුද්ගලයෙක් - පුද්ගල ගිණුම්කරණය
2. ව්‍යාපාරයක - ව්‍යාපාර ගිණුම්කරණය
3. ආයතනයක් - සමාජ හා පොදු ගිණුම්කරණය
4. රජයක් - රාජ්‍ය ගිණුම්කරණය
5. ජාතියක් - ජාතික ගිණුම්කරණය

මේ අනුව ගිණුම්කරණ කටයුතු සිදු කිරීම සඳහා තෝරාගනු ලබන ගිණුම්කරණ ඒකකයේ ස්වභාවය අනුව ගිණුම්කරණ ඒකකයන් ඉහත පරිදි වර්ග කළ හැකි ය.

## ගිණුම්කරණ ඒකක සංකල්පය
**Accounting Entity Concept**

..........................................................................................................................................

..........................................................................................................................................


..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

## ගිණුම්කරණයේ ප්‍රභේද
**Type of Accounting**



## මූල්‍ය ගිණුම්කරණය යනු,

කිසියම් ගිණුම්කරණ ඒකකයක් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අවශ්‍ය වන්නා වූ මූල්‍ය තොරතුරුවලට අදාළ මූල්‍ය දත්ත රැස් කිරීම, වාර්තා කිරීම, වර්ග කිරීම, සාරාංශ කිරීම, විශ්ලේෂණය, අර්ථකථනය හා සන්නිවේදනය කිරීමේ ක්‍රියාවලිය යි.

## කළමනාකරණ ගිණුම්කරණය යනු,

ආයතනයක සියලු ම කළමනාකරණ මට්ටම්වලට අවශ්‍ය වන පරිදි සැලසුම් කිරීම, පාලනය කිරීම, තීරණ ගැනීම, වගකීම් ඉටු කිරීමට හැකිවන සේ මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීම කළමනාකරණ ගිණුම්කරණය යි.

### මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර වෙනස්කම්

**ගිණුම්කරණය**

| .................................................... | ............................................................................................ |
|---|---|
| Financial Accounting | Management Accounting |
| ■ ඓතිහාසික / අතීත තොරතුරු ඉදිරිපත් කරයි. | ■ ................................................................................. ................................................................................. |
| ■ මූල්‍යමය තොරතුරු ඉදිරිපත් කරයි. | ■ ................................................................................. ................................................................................. |
| ■ ගිණුම් තොරතුරු අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයන් ප්‍රයෝජනයට ගනී. | ■ ................................................................................. ................................................................................. |
| ■ වාර්තා කිරීමෙ වාර ගණන නිශ්චිතයි. සාමාන්‍යයෙන් වාර්ෂිකව, සය මාසිකව හෝ කාර්තු වශයෙන් පිලියෙල කෙරේ. | ■ ................................................................................. ................................................................................. ................................................................................. ................................................................................. |
| ■ ගිණුම්කරණ සංකල්ප, නීතිරීති, සම්ප්‍රදායන්, ගිණුම්කරණ ප්‍රමිත යොදා ගනියි. | ■ ................................................................................. ................................................................................. |

## අභ්‍යාසය 03

01. 'ව්‍යාපාරය හා අයිතිකරු එකිනෙකින් වෙන් වූ ස්වාධීන අස්තිත්ව දෙකක් සේ සලකා ගනුදෙනු හඳුනා ගනී.'

පහත සඳහන් ගිණුම්කරණ සංකල්ප අතුරින්, ඉහත සඳහන් ප්‍රකාශනය, පැහැදිලි කරන්නේ කුමන සංකල්පයෙන් ද?

(1) අස්තිත්ව (Entity) සංකල්පය
(2) අඛණ්ඩ පැවැත්ම (Going Concern) සංකල්පය
(3) සංගතතා (Consistency) සංකල්පය
(4) ආරක්ෂණ (Prudence) සංකල්පය **(AAT - July 2020)**

02. පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කළමනාකරණ ගිණුම්කරණය මගින් බාහිර ඇල්මැති පාර්ශ්වයන්ට (stakeholders) පමණක් තොරතුරු සපයයි.
(2) මූල්‍ය ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ වංචා සහ වැරදි වැළැක්වීම යි
(3) ගනුදෙනු යනු ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ නිමැවුම වේ
(4) අදාළ බව යනු මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ලක්ෂණයකි

**(AAT - January 2019)**

03. ගිණුම්කරණයේ ප්‍රාථමික කාර්යභාරය වනුයේ,

(1) අස්තිත්වයක ගනුදෙනු හා සිදුවීම් ගිණුම් පොත්වල සටහන් කිරීම ය.
(2) අස්තිත්වයක ගනුදෙනු හා සිදුවීම් මැනීම, වාර්තා කිරීම සහ සාරාංශගත කිරීම ය.
(3) තීරණ ගැනීම සඳහා අස්තිත්වය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශ්වයන්ට (Stakeholders) අස්තිත්වයේ මූල්‍ය තොරතුරු සැපයීම ය.
(4) කළමණාකරුවන්ට ඔවුන්ගේ තිරණ ගැනීම පිණිස අස්තිත්වයක තොරතුරු සැපයීම සහ විශ්ලේෂණය කිරීම ය. **(AAT - July 2015)**

04. (a) සකස් කෙරෙන වාර්තා වර්ග (Types of reports produced)
(b) වාර්තා කෙරෙන වාර ගණන (Frequency of reporting)
(c) වාර්තා ආකෘතිය (The format of reports)
(d) වාර්තා භාවිත කරන්නන් (The users of reports)

මූල්‍ය ගිණුම්කරණය, කළමණාකරණ ගිණුම්කරණයෙන් වෙනස්කොට දැක්වීම සඳහා ඉහත සඳහන් කුමන අංග භාවිත හැකි ද?

(1) (a) සහ (b) පමණි
(2) (b) සහ (c) පමණි
(3) (a), (b) සහ (c) පමණි
(4) ඉහත සඳහන් සියල්ලම වේ **(AAT - July 2015)**

05. පහත දැක්වෙන අය අතුරෙන්, මූල්‍ය ගිණුම් තොරතුරු ප්‍රයෝජනයට ගන්නා බාහිර පාර්ශ්වයන් කවුරුන්ද?

(1) ණයටදෙන්නන්

(2) ආයෝජකයින්

(3) ගනුදෙනුකරුවන්

(2) ඉහත සඳහන් සියලුම දෙනා **(AAT - January 2015)**

06. පහත සඳහන් ඒවා අතුරෙන් වඩාත්ම නිවැරදි ප්‍රකාශය වනුයේ:

(1) මූල්‍ය ගිණුම්කරණයෙන් අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව දෙකටම තොරතුරු සපයන නමුත්, පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණයෙන් තොරතුරු සපයන්නේ කළමනාකරණයට පමණි.

(2) මූල්‍ය ගිණුම්කරණයේ දී වාර්ෂික ගිණුම් පමණක් පිළියෙල කරනු ලබන නමුත්, පිරිවැය හා කළමනාකරණ ගිණුම්කරණයේදී නිරතුරුව කාලාන්තර අතර ගිණුම් පිළියෙල කරනු ලැබේ.

(3) මූල්‍ය ගිණුම් පිළියෙල කිරීම ලාභ සඳහා සහ ලාභාපේක්ෂාවෙන් තොරව යන දෙආකාරයෙන්ම පවත්වාගෙන යන අස්තිත්වයන් සඳහා වන නමුත්, පිරිවැය ගිණුම් පිළියෙල කිරීම ලාභ සඳහා පවත්වාගෙන යන අස්තිත්වයන් වෙනුවෙන් පමණක් සිදු කෙරේ.

(4) ඉහතින් ඇති (2) හා (3) යන ප්‍රකාශ දෙකම නිවැරදිය. **(AAT - July 2011)**

07. පහත සඳහන් ප්‍රකාශවලින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මූල්‍ය ගිණුම්කරණයෙන් තොරතුරු සපයනුයේ අස්තිත්වයේ අභ්‍යන්තර පාර්ශ්වයන්ට පමණි.

(2) පිරිවැය ගිණුම්කරණයෙන් බලාපොරොත්තු වන්නේ අස්තිත්වයෙන් බාහිර පාර්ශ්වයන්ට තොරතුරු සැපයීම යි.

(3) මූල්‍ය ගිණුම්කරණය මූලික වශයෙන් අතීත ගනුදෙනු හා සිද්ධීන් (Past transactions and events) කෙරෙහි අවධානය යොමු කරයි.

(4) (2) සහ (3) යන ඉහත සඳහන් ප්‍රකාශ දෙකම නිවැරදි ය. **(AAT - Dec 2010)**

# ගිණුම්කරණ පරිසරය
# Accounting Environment

ගිණුම්කරණය සඳහා විවිධාකාර පාරිසරික සාධකයන් බලපෑම් කරන අතර, මූලිකව ම ව්‍යාපාර හා එහි ගිණුම්කරණය කෙරෙහි බලපෑම් කරන පාරිසරික සාධකයන් මොනවා ද? යන්න පිළිබඳව අවබෝධ කරගත යුතු ය. මේ සඳහා PESTEL විශ්ලේෂණය යොදා ගතහැකි අතර එහි පහත පරිසරාත්මක සාධකයන් විශ්ලේෂණය කරයි.

- දේශපාලනික Political **(P)**
- ආර්ථික Economical **(E)**
- සමාජීය Social **(S)**
- තාක්ෂණික Technological **(T)**
- පාරිසරික Environmental **(E)**
- නෛතික Legal **(L)**

→ **P+E+S+T+E+L**
**PESTEL විශ්ලේෂණය**

ව්‍යාපාරික ආයතනයක්, ඊට අදාළ වෙළෙඳපොළ තුළ ස්ථානගත වීමටත්, ඒ අනුව එහි ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ වෙනස්කම් සිදු කිරීමටත්, මෙම පාරිසරික සාධකයන් ඍජුව හෝ වක්‍රව බලපානු ලබයි.

## පාරිසරික සාධකවල වෙනස්වීම ගිණුම්කරණය කෙරෙහි බලපාන ආකාරය
*Inpact of Changes in Environmental Factors on Accounting*

- **දේශපාලනික (Political)**

  කිසියම් ආර්ථික කටයුත්තකට හෝ ව්‍යාපාර කෙරෙහි කිසියම් රටක රජයක් දායක වන ආකාරය සහ දේශපාලනික තීරණ බලපෑම් කරන ආකාරය මෙයට අදාළ වේ.
  උදාහරණ: රාජ්‍ය ප්‍රතිපත්ති, දේශපාලනික ස්ථාවරත්වය, වරාය හා නිශ්කාර්ෂණ රෙගුලාසි, විදේශ වෙළෙඳාම් ප්‍රතිපත්ති.

- **ආර්ථික (Economic)**

  රටක ක්‍රියාත්මක වන්නා වූ ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස් වීම ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන ආකාරය මෙයට අදාළ වේ.
  උදාහරණ: උද්ධමන අනුපාතය, පොලී අනුපත, විනිමය අනුපාත, බදු ප්‍රතිපත්ති, මිල මට්ටම්

- **සමාජීය (Social)**

  සමාජීය හා සංස්කෘති පරිසරාත්මක සාධකයක් ලෙස ද මෙය හැඳින්වේ. රටක ජන සමූහය තුළ පවත්නා වූ ආකල්ප හා ජීවන රටාවෙහි ඇති වන්නා වූ වෙනස්කම් මෙයට අදාළ වේ.
  උදාහරණ: ජනගහන වර්ධනය, ආගමික ආකල්ප, ජන ව්‍යුහය, ජන සංඛ්‍යාව

- **තාක්ෂණික (Technological)**

  තාක්ෂණික විධි ක්‍රම හා ශිල්පීය ක්‍රමයන්ගේ වෙනස්වීම් මෙයට අදාළ වේ. ව්‍යාපාරවල ගිණුම්කරණ කටයුතු පහසු කිරීම සඳහා විවිධ තාක්ෂණික ක්‍රම භාවිතයට ගනු ලැබේ.
  උදාහරණ: ගණක යන්ත්‍ර හා පරිගණක යන්ත්‍ර භාවිතය, ගිණුම්කරණ මෘදුකාංග ඇසුරින් ගිණුම්කරණ කටයුතු සිදු කිරීම

- **පාරිසරික (Environmental)**

  මෙම සාධකයත් වර්තමානයේ දී ව්‍යාපාරයන් අතර ප්‍රමුඛස්ථානයට පැමිණ ඇත. අමුද්‍රව්‍යවල හිඟය, පරිසර දූෂණය ඉලක්ක ඇති කර ගනිමින් ව්‍යාපාර හා ගිණුම්කරණ කටයුතු ව්‍යාපාරික සමාජ වගකීම සහ තිරසාර බව මුල්කර ගනිමින් ක්‍රියාත්මක කිරීම සිදු කරමින් සිටී.
  උදාහරණ: කාබන් වියෝජන ඉලක්ක (Carbon Footprint Targets), විවිධ පාරිසරික සංරක්ෂණ සහතික (Forest Stewardship Council Certification (FSC), ISO 14001)

- **නෛතික (Legal)**

  එනම් රටක ආර්ථිකයක පවත්නා වූ නීතිරීති පද්ධතිය ව්‍යාපාර හා ගිණුම්කරණ කටයුතු සඳහා බලපානු ලබන ආකාරය යි.

  උදාහරණ: 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත, 2007 අංක 07 දරන සමාගම් පනත, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත, දේශීය ආදායම් බදු පනත, විනිමය නීතිරීති, ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත.

## අභ්‍යාසය 04

01. 'COVID-19' වසංගතය හේතුවෙන්, ලොව පුරා කාබන් මට්ටමේ (carbon footprint level) හෝ කාබනඩයොක්සයිඩ් විමෝචන මට්ටමේ අඩු වීමක් සිදුව ඇත. කාබන් මට්ටම යන සංකල්පය PESTEL විශ්ලේෂණය තුළ අන්තර්ගත වන්නේ,

    (1) තාක්ෂණික සාධකයක් ලෙස යි  (2) පාරිසරික සාධකයක් ලෙස යි
    (3) ආර්ථික සාධකයක් ලෙස යි  (4) සමාජීය සාධකයක් ලෙස යි

    **(AAT - July 2020)**

02. ගිණුම්කරණයට බලපාන පරිසර සාධක හතරක් නම් කරන්න. **(A/L 2006)**

# වෘත්තීය ගිණුම්කරණ ආයතන

## Professional Accounting Bodies

ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන වෘත්තීය ගිණුම්කරණ ආයතන

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
   The Institute of Chartered Accountants of Sri Lanka (CA Sri Lanka)

   1959 අංක 23 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ශ්‍රී ලංකාවේ වෘත්තිය ගිණුම්කරණ ආයතනයකි.

2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනය
   Association of Accounting Technicians of Sri Lanka (AAT)

   මධ්‍ය මට්ටමේ ගණකාධිකාරීවරුන් බිහි කිරීමේ අරමුණ ඇතිව 1987 වර්ෂයේ දී මෙම ආයතනය ආරම්භ කර ඇත.

3. සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය
   Institute of Certified Management Accountants (CMA)

   2009 අංක 23 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කර ඇත.

4. සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනය
   Association of Certified Chartered Accountants (ACCA)

5. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය
   Chartered Institute of Management Accountants (CIMA)

# ගිණුම්කරණ ක්‍රියාවලිය

## ගිණුම්කරණ යෙදවුම් හා නිමැවුම් ක්‍රියාවලිය

ගිණුම්කරණය සාමාන්‍ය නිෂ්පාදන ආයතනයක ක්‍රියාවලියට සමානය. අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදන ක්‍රියාවලියක් අනුසාරයෙන් නිමි භාණ්ඩයක් නිපදවීම නිෂ්පාදන ආයතනයක සිදුවේ. එහිදී අමුද්‍රව්‍ය යෙදවුම් ලෙසද නිමි භාණ්ඩ නිමැවුම් ලෙසද සැලකිය හැකිය. ගිණුම්කරණයේදී ද ගනුදෙනු හා සිද්ධීන් අනුසාරයෙන් ගිණුම්කරණ ක්‍රියාවලිය මගින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කෙරේ. මෙහිදී ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ යෙදවුම් ලෙසත් සැලකිය හැකිය.

| යෙදවුම් (Inputs) | | ගිණුම්කරණ ක්‍රියාවලිය (Accounting Process) | | නිමැවුම් (Output) |
| --- | --- | --- | --- | --- |
| ගණුදෙනු හා සිද්ධීන් | → | රැස් කිරීම<br>වාර්තා කිරීම<br>වර්ග කිරීම<br>සාරාංශ කිරීම<br>විශ්ලේෂණය කිරීම<br>අර්ථකථනය කිරීම<br>සන්නිවේදනය කිරීම | → | මූල්‍ය ප්‍රකාශන |

## ගිණුම්කරණ යෙදවුම්
**Accounting Inputs**

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා ගිණුම්කරණ යාන්ත්‍රණයට ඇතුළත් කරනු ලබන ව්‍යාපාර ඒකකයේ ගනුදෙනු හා සිද්ධීන් පිළිබඳ අමුදත්ත ගිණුම්කරණ යෙදවුම් වේ.

| ගනුදෙනු (Transactions) | සිද්ධීන් (Events) |
|---|---|
| කළමනාකරණ තීරණයක ප්‍රතිඵලයක් ලෙස කිසියම් පාර්ශ්වයන් දෙකක් අතර මුදලින් මැනිය හැකි ආකාරයේ සම්පත් හුවමාරු වීමක් ගනුදෙනුවක් නම් වේ.<br>උදා:- ..........<br>..........<br>..........<br>..........<br>..........<br>..........<br>.......... | පාර්ශ්වයන්ගේ සම්බන්ධතාවයකින් තොරව මුදලින් මැනිය හැකි සම්පත්වල වෙනස් වීමක් සිද්ධීන් නම් වේ.<br>උදා:- ..........<br>..........<br>..........<br>..........<br>.......... |

# ගිණුම්කරණ ක්‍රියාවලිය

## 1. මූල්‍ය දත්ත රැස් කිරීම (Collecting)

ව්‍යාපාර ගනුදෙනු හා සිද්ධීන්වලට අදාල මූල්‍ය දත්තයන් මූලාශ්‍ර ලේඛන ඇසුරින් රැස් කිරීම මෙහිදී සිදුවන ක්‍රියාදාමය වේ.

උදාහරණ:

- විකුණුම් ඉන්වොයිස්, ගැනුම් ඉන්වොයිස්, මුදල්
- ගෙවීම් වවුචර යනාදිය මගින් දත්ත රැස් කිරීම

## 2. වාර්තා කිරීම (Recording)

රැස්කරගත් ගනුදෙනු හා සිද්ධීන් සුදුසු ගිණුම්කර ආකෘතීන් එනම්, මූලික සටහන් පොත් / උපයෝගී පොත් තුළ වාර්තා කර ගැනීම මෙහිදී සිදුවන ක්‍රියාදාමය වේ.

උදාහරණ:

- විකුණුම් ඉන්වොයිසි, විකුණුම් ජ'නලය තුළ වාර්තා කිරීම
- මුදල් ගෙවීමේ වවුචර් මුදල් ගෙවීමේ ජ'නලය තුළ වාර්තා කිරීම

## 3. වර්ග කිරීම (Classification)

මූලික සටහන් පොත්වල වාර්තා කළ ගනුදෙනු හා සිද්ධීන් ලෙජරයේ ගිණුම්වල වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හා හිමිකම් ලෙස වර්ග කරමින් පිටපත් කිරීම මෙහිදී සිදුවන ක්‍රියාදාමය වේ.

උදාහරණ:

- මෝටර් රථයක් මිල දී ගැනීම වත්කමක් ලෙස සලකා මෝටර් රථ වත්කම් ගිණුමේ වාර්තා කිරීම
- මෝටර් රථ අලුත්වැඩියා වියදමක් ලෙස සලකා මෝටර් රථ අලුත්වැඩියා වියදම් ගිණුමේ සඳහන් කිරීම

## 4. සාරාංශ කිරීම (Summerizing)

වර්ග කිරීම් කරන ලද ලෙජර් ගිණුම් ශේෂ කර, එම ශේෂයන් ආශ්‍රයෙන් ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීමත් එම දත්තයන් සරල නිශ්චිත තොරතුරු බවට පත් කිරීමත් මෙහිදී සිදුවන ක්‍රියාදාමය වේ.

උදාහරණ:

- ලෙජර් ගිණුම් ශේෂ කිරීම
- ශේෂ පිරික්සුම පිළියෙල කිරීම
- දළ ලාභය, ශුද්ධ ලාභය ගණනය කිරීම

## 5. විශ්ලේෂණය හා අර්ථකථනය (Analysing and Interpreting)

සාරාංශ කරන ලද දත්ත ඇසුරින් තීරණ ගැනීමට වඩාත් උචිත තොරතුරු සන්සන්දනය කිරීමත් මෙහිදී සිදුවන ක්‍රියාදාමය වේ.

උදාහරණ:

- ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය
- මූල්‍ය වාර්තා පසුගිය වාර්ෂවල වාර්තා සමග සැසඳීම

## 6. සන්නිවේදනය කිරීම (Communicating)

විශ්ලේෂණය හා අර්ථකථනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඒවා පරිශීලනය කිරීමට ඒවා පරිශීලනය කිරීමට බලාපොරොත්තු වන පාර්ශ්වයන්ට ඔවුන්ගේ ආර්ථික තීරණ ගැනීම සඳහා ලබා දීම මෙහිදී සිදුවන ක්‍රියාදාමය වේ.

උදාහරණ:

- මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවල (Annual Report) ඇතුළත් කිරීම

### ගිණුම්කරණ නිමැවුම්

**Accounting Outputs**

ව්‍යාපාර ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ යාන්ත්‍රණයට ඇතුළත් කොට නිමවනු ලබන මූල්‍ය ප්‍රකාශ ගිණුම්කරණ නිමැවුම් වේ.

### මූල්‍ය ප්‍රකාශන සංරචක

**Compornent of Financial Statements**

සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශ කට්ටලයකට අයත් සංරචක

1. ........................................................................ **(Statement of Financial Position)**

   කිසියම් දිනකට ව්‍යාපාරයක පවතින වත්කම්, වගකීම් හා හිමිකම් අතර වූ සම්බන්ධය නැතහොත් මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරනු ලබන ප්‍රකාශයයි.

2. ..............................................................................................................................................

   **(Statement of Profit or Loss and other Comprehensive Income)**

   ගිණුම් කාලච්ඡේදය සඳහා ලාභදායකත්වය (උපයන ලද ලාභය / අලාභය) නැතහොත් කාර්ය සාධනය ගණනය කිරීමට සකස් කරන ප්‍රකාශයයි.

3. ..................................................................................................................................................

**(Change In Equity Statement)**

ගිණුම් කාලච්ඡේදය තුළ අයිතිකරුවන්ගේ හිමිකම වෙනස් වූ ආකාරය පෙන්නුම් කරන වාර්තාවයි.

4. ....................................................................... **(Cash Flow Statement)**

ගිණුම් කාලච්ඡේදය තුළ මුදල් හා මුදල් වලට සමාන දෑ ව්‍යාපාරය තුළට ගලා ආ ආකාරය හා එවැනි සම්පත් ව්‍යාපාරයෙන් පිටතට ගලා ගිය ආකාරයන් පෙන්නුම් කරනු ලබන ප්‍රකාශනය වේ.

5. ..................................................................................................................................

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී භාවිතා කරනු ලැබූ ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් අයිතම විස්තරාත්මකව පැහැදිලි කිරීමේ සටහන් අඩංගු වන ප්‍රකාශනයයි.

## අභ්‍යාසය 05

01. පහත සඳහන් ඒවා අතුරෙන්, ගිණුම්කරණ ක්‍රියාවලියේ ගිණුම්කරණ යෙදවුමක් (input) වන්නේ කුමක් ද?

(1) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(3) ගනුදෙනු
(4) ඉහත සඳහන් සියල්ල ම

**(AAT - January 2018)**

02. පහත සඳහන් ඒවා අතුරෙන්, සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සංරචකයක් වන්නේ කුමක්ද?

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(2) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(3) ස්කන්ධයේ වෙනස්වීම් දක්වෙන ප්‍රකාශනය
(4) ඉහත සඳහන් ඒවා සියල්ලම

**(AAT - July 2017)**

03. පහත සඳහන් ඒවා අතුරෙන් අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන මගින් ජනනය නොවන්නේ කුමක්ද?

(1) අස්තිත්වයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු
(2) අස්තිත්වයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු
(3) මූල්‍ය තත්ත්වයේ වෙනස්වීම් පිළිබඳ පිළිබඳ තොරතුරු
(4) සංවිධාන ව්‍යුහයේ වෙනස්වීම් පිළිබඳ තොරතුරු

**(AAT - January 2017)**

04. "මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය" පිළියෙල කරනු ලබන්නේ,

(1) කිසියම් නිශ්චිත දිනකට අස්තිත්වයේ මූල්‍ය තත්වය නියෝජනය කිරීමට ය
(2) කිසියම් කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්වයේ මූල්‍ය කාර්යසාධනය නියෝජනය කිරීමටය
(3) අනාගත කාලපරිච්ඡේදයක් සඳහා පුරෝකථනය කෙරෙන මූල්‍ය තත්ත්වය නියෝජනය කිරීමට ය
(4) කිසියම් කාලපරිච්ඡේදයක් තුල වත්කම්, බැරකම් සහ ස්කන්ධයේ සිදු වූ සංචලනයන් නියෝජනය කිරීමට ය **(A/L - July 2015)**

05. පහත දැක්වෙන ඒවා අතුරෙන් මූල්‍ය ප්‍රකාශ කට්ටලයක සංරචකයක් (කොටසක්) නොවෙන්නේ කුමක්ද?

(1) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(2) ආදායම් ප්‍රකාශය
(3) ස්කන්ධයේ වෙනස්වීම දැක්වෙන ප්‍රකාශය
(4) පොදු ලෙජරය **(A/L - January 2015)**

06. පහත සඳහන් ඒවා අතුරෙන් ගිණුම්කරණ යෙදවුමක් (Accounting input) ලෙස සලකනු ලබන්නේ කුමක් ද?

(1) ආදායම් ප්‍රකාශය
(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(3) දෛනික විකුණුම් පොත
(4) නිෂ්පාදන ගිණුම **(A/L - July 2014)**

07. ගිණුම්කරණ නිමැවුමක් (output) ලෙස සලකනු නොලබන්නේ පහත සඳහන් ඒවායින් කවරක්ද?

(1) ආදායම් ප්‍රකාශය
(2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(3) මුදල් ප්‍රවාහා ප්‍රකාශය
(4) විකුණුම් දෛනික පොත **(AAT - Jan 2012)**

08. ගිණුම්කරණයේ නිමැවුමක් (output of accounting) ලෙස සලකනු නොලබන්නේ පහත සඳහන් ඒවායින් කවරක්ද:

(1) උපයෝගී ලෙජරය (Subsidiary ledger)
(2) මුදල් ප්‍රවාහ ප්‍රකාශය
(3) ආදායම් ප්‍රකාශය
(4) මූල්‍ය තත්ව ප්‍රකාශය **(AAT - June 2010)**

## ගිණුම්කරණ තොරතුරු සැපයීම පිළිබඳ වගකීම / මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

ව්‍යාපාරයකට අදාළ මූල්‍යමය තොරතුරු සපයනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශන මගිනි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම් ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය හෝ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවට ආයතනයේ ක්‍රියාත්මක වන පාලන අධිකාරිය විසින් දැරිය යුතුය.

එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම දරන අධ්‍යක්ෂකවරු හෝ පාලන අධිකාරියට අයත් නිලධාරීන් අදාළ වගකීම භාර ගනිමින් මූල්‍ය ප්‍රකාශන අත්සන් කළ යුතු වේ.

# මූල්‍ය ප්‍රකාශන මූලිකාංග
# Elements of Financial Statements

මූල්‍ය ප්‍රකාශන මගින් ආර්ථික ලක්ෂණ මත පදනම්ව ගනුදෙනු සහ වෙනත් සිද්ධි පුළුල් පරාසයකට කාණ්ඩ ගතකොට ඒවායේ මූල්‍ය බලපෑම පෙන්නුම් කරනු ලබයි. මෙම පුළුල් පැතිකඩයන් මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග ලෙස හඳුන්වනු ලැබේ.

මූල්‍ය තත්ත්වය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) හා සෘජුවම සම්බන්ධ වන මූලිකාංග වනුයේ,

- ..................................................
- ..................................................
- ..................................................

කාර්යසාධනය (ආදායම් ප්‍රකාශය) හා සෘජුව ම සම්බන්ධ වන මූලිකාංග වනුයේ,

- ..................................................
- ..................................................

# වත්කම්
# Assets

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

වත්කමක ලක්ෂණ

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වත්කම් පහත පරිදි වර්ග කරනු ලැබේ.

වත්කම් (Assets)

........................................ ................................................

## ජංගම වත්කම්
## Current Assets

- වාර්තා කරන දිනයේ සිට ඉරිදි මාස 12 ක කාලයක් තුළ උපලබ්ධි වනු ඇතැයි අපේක්ෂා කරන වත්කම් ජංගම වත්කම් නම් වේ.

උදා:- අමුද්‍රව්‍ය තොග
නොනිමි භාණ්ඩ තොග
නිමි භාණ්ඩ තොග
වෙළඳ ණයගැතියෝ
ඉදිරියට ගෙවූ වියදම්
මුදල් හා බැංකු ශේෂයන්

# ජංගම නොවන වත්කම්

## Non Current Assets

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

### අභ්‍යාසය 06

01. පහත සඳහන් ඒවා අතුරෙන්, ආදායම් ප්‍රකාශයේ මූලිකාංග වන්නේ කුමක් ද?
    (1) වත්කම් (2) ස්කන්ධය
    (3) ආදායම් (4) වගකීම් **(AAT - July 2020)**

02. පහත සඳහන් ඒවා අතුරෙන් "ආදායම් ප්‍රකාශනයේ" මූලිකාංග අඩංගු කාණ්ඩය කුමක් ද?
    (1) වත්කම් සහ වගකීම් (2) වගකීම් සහ ආදායම්
    (3) වියදම් සහ ස්කන්ධය (4) ආදායම් සහ වියදම්
    **(AAT - January 2019)**

03. වත්කමක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. **(A/L 2008)**

04. පහත ඒවායින් වත්කමක අත්‍යාවශ්‍ය ගති ලක්ෂණයක් වන්නේ කුමක්ද?
    (1) සීමිත ප්‍රයෝජනවත් ජීවිත කාලයක් තිබීම
    (2) ස්පෘශ්‍ය බව
    (3) අනාගත ගණුදෙණු සහ සිද්ධි තුළින් පැන නැගීම
    (4) අනාගත ආර්ථික ප්‍රතිලාභ ගැබ්වී තිබීම
    (5) ආර්ථික ප්‍රතිලාභ වල පාලනය සැම විටම නෛතික හිමිකාරීත්වය තුළින් පැන නැගීම
    **(A/L 2009)**

**අතිරේක සටහන්**

**භෞතික පදනම මත වත්කම් වර්ගීකරණය**

වත්කම් භෞතිකමය වශයෙන් පියවි ඇසට පෙනේ ද නොපෙනේ ද භෞතිකමය වශයෙන් ස්පර්ශ කළ හැකි ද යන කරුණු මත වත්කම් වර්ග දෙකකි.

1. ස්පෘශ්‍ය වත්කම්
2. අස්පෘශ්‍ය වත්කම්

**ස්පෘශ්‍ය වත්කම්** (Tangible Assets)

භෞතික පැවැත්මක් ඇති එනම්, පියවි ඇසින් දැකිය හැකි, භෞතිකමය වශයෙන් ස්පර්ශ කළ හැකි වත්කම් ස්පෘශ්‍ය වත්කම් ලෙස හැඳින්වේ.
උදා:- ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, යන්ත්‍ර උපකරණ, ලී බඩු උපකරණ, බඩු තොගය

**අස්පෘශ්‍ය වත්කම්** (Intangible Assets)

භෞතික පැවැත්මක් නැති එනම්, පියවි ඇසින් දැකිය නොහැකි භෞතිකමය වශයෙන් ස්පර්ශ කළ නොහැකි වත්කම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හැඳින්වේ.
උදා:- කීර්තිනාමය, ආයෝජන, ස්වාධිකාරය, වෙළෙඳ ලකුණ

# වගකීම්
# Liabilities

.......................................................................................................................................

.......................................................................................................................................

**වගකීම්වල ලක්‍ෂණ**

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වගකීම් පහත පරිදි වර්ග කරනු ලැබේ.

වගකීම් (Liabilities)

.......................................... ..............................................

## ජංගම වගකීම්
## Current Liabilities

- වාර්තාකරන දිනයේ සිට මාස 12 ක කාලයත් තුළ ගෙවා නිම කිරීමට අපේක්ෂිත වගකීම් ජංගම වගකීම් නම් වේ.

  උදා:- වෙළඳ ණයහිමියෝ, උපචිත මෙහෙයුම් වියදම්, බැංකු අයිරාව, කලින් ලද ආදායම්, ගෙවිය යුතු ආදායම් බදු

## ජංගම නොවන වගකීම්
## Nun-Current Liabilities

ජංගම වගකීම් වල ඇතුළත් ලක්ෂණ අඩංගු නොවන දිගුකාලීන ස්වභාවයක් ගන්නා වගකීම් ජංගම නොවන වගකීම් වේ.

උදා: දිගුකාලීන බැංකු ණය, ණයකර

# හිමිකම හෙවත් ස්කන්ධය
# Equity

ව්‍යාපාර ආයතනයක වත්කම් වලින් මුළු බාහිර වගකීම් අඩු කළ පසු අගයයි. මෙය ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය ලෙස ද හැඳින්වේ.

# ආදායම්
# Revenues / Income

ව්‍යාපාරයක ආදායම් පහත පරිදි වර්ග කළ හැක.

**ආදායම්**

ප්‍රාග්ධන ආදායම්
(Capital Income)

ප්‍රාග්ධන ආදායම් යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් බැහැරව ප්‍රාග්ධන ස්වරූපයේ ගනුදෙනු වලින් ලැබූ ආදායම්ය. එනම්, ස්ථාවර වත්කම් හෝ විශේෂ අරමුදල් පදනම් කරගෙන ඉපයූ ආදායම්ය.

උදා: දේපළ, පිරියත හා උපකරණ විකුණුම් ආදායම්

අයභාර ආදායම්
(Revenue Income)

ව්‍යාපාරයක් තම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් උපයන, හිමිකරුවන්ට බෙදා දිය හැකි ලාභය තීරණය කිරීමේ දී සැලකිල්ලට ගන්නා ආදායම් අයභාර ආදායම් වේ.

උදා: විකුණුම් ආදායම්

# වියදම්
# Expenditure


....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

ව්‍යාපාරයක වියදම් පහත පරිදි වර්ග කළ හැකිය.




## ප්‍රාග්ධන වියදම්
## Capital Expenditure

ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීමට, ඉදිකිරීමට හා ඒවා වැඩි දියුණු කිරීමට දරන වියදම් ප්‍රාග්ධන වියදම් වේ. සාමාන්‍යයෙන් ව්‍යාපාරයක එදිනෙදා ව්‍යාපාර කටයුතු සඳහා දරන වියදම් මීට අයත් නොවේ. ප්‍රාග්ධන වියදම් යන්නට පහත දැක්වෙන වියදම් වර්ග අයත් වේ.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

# අයභාර වියදම්
## Revenue Expentiture

ව්‍යාපාරයක් විසින් ආදායම් ඉපයීමේ අරමුණින් එදිනෙදා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමේ දී අවශ්‍යයෙන්ම දැරීමට සිදුවන සාමාන්‍ය වියදම් අයභාර වියදම් වේ. මෙම වියදම් ව්‍යාපාරයකට දැරීමට සිදුවන්නේ දේපල, පිරියත හා උපකරණ නඩත්තු කිරීමටත්, ජංගම වත්කම් අත්පත් කර ගැනීමට හා ඒවා නඩත්තු කිරීමටත්ය. දේපල, පිරියත හා උපකරණ අළුත්වැඩියා කිරීමට දරන වියදම් ද, දේපල, පිරියත හා උපකරණ වල ක්ෂය වීම් ද, විකිණීම සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ වියදම් ද අයභාර වියදම් වලට අයත් වේ.

පහත සඳහන් වන්නේ අයභාර වියදම් සඳහා නිදසුන් කිහිපයකි.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

### අභ්‍යාසය 07

01. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ABC ට්‍රේඩර්ස් විසින් පහත සඳහන් වියදම් දරා තිබේ.

| විස්තරය | රු. |
|---|---|
| ප්‍රදර්ශනාගාරයේ ඉදිකිරීමේ පිරිවැය | 525,000 |
| ප්‍රදර්ශනාගාරයේ සේවකයන්ට ගෙවූ වැටුප් | 63,000 |
| වායු සමීකරණයේ පිරිවැය | 92,000 |
| 2018/19 වර්ෂය සඳහා ප්‍රදර්ශනාගාරයේ රක්ෂණ වාරිකය | 28,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ABC ට්‍රේඩර්ස්හි මුළු ප්‍රාග්ධන වියදම වන්නේ,

(1) රු. 708,000/-  (2) රු. 617,000/-

(3) රු. 525,000/-  (4) රු. 680,000/-  **(AAT - July 2019)**

02. සීමාසහිත ABC සමාගම 2017 ජූනි මාසය තුළ දී පහත සඳහන් වියදම් දරා ඇත.

| විස්තරය | රු. |
|---|---|
| කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 765,000 |
| නිෂ්පාදන අංශය සඳහා නව යන්ත්‍රයක් මිලට ගැනීම | 1,000,000 |
| කර්මාන්තශාලා සේවකයින්ට ගෙවූ වැටුප් | 550,000 |
| නව යන්ත්‍රය සවි කිරීමේ (Installation) පිරිවැය | 50,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2017 ජූනි මාසය තුළ සීමාසහිත ABC සමාගම විසින්, දරණ ලද මුළු "අයභාර" වියදම වන්නේ,

(1) රු. 600,000/- (2) රු. 550,000/-
(3) රු. 1,600,000/- (4) රු. 765,000/- **(AAT - January 2018)**

03. "ප්‍රාග්ධන වියදම්" (Capital Expenditure) සහ "අයභාර වියදම්" (Revenue Expenditure) කෙටියෙන් පැහැදිලි කර, එක් එක් වියදම් වර්ගය සඳහා උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

**(AAT - January 2017)**

04. පහත සඳහන් එක් එක් වියදම් "ප්‍රාග්ධන වියදම්" හෝ "අයභාර වියදම්" ලෙස වර්ගීකරණය කරන්න.

(1) ගොනැගිල්ලක් ඉදි කිරීම සඳහා රු. 1,850,000/- ක වියදම් දැරීම.
(2) රු. 400,000/- ක අළුත් යන්ත්‍රයක් මගින් පැරණි යන්ත්‍රය ප්‍රතිසම්පාදනය කරන ලදී. මෙමඟින් නිෂ්පාදන ධාරිතාව ඒකක 5,000 කින් වැඩි විය.
(3) බෙදාහැරීමේ වාහනයේ තිබූ ටයර් ප්‍රතිසම්පාදනය සඳහා රු. 60,000/- ක් දරණ ලදී.

**(AAT - July 2015 - 03 Marks)**

05. පහත දැක්වෙන ඒවා අතුරෙන් ප්‍රාග්ධන වියදමක් නොවන්නේ කුමක්ද?

(1) තිබෙන ස්ථාවර වත්කමක ඉපැයීමේ ධාරිතාව වැඩි කිරීමේ පිරිවැය.
(2) යන්ත්‍රයක් අත්පත් කර ගැනීම සඳහා වන පිරිවැය.
(3) අළුත් යන්ත්‍රයක් සවිකිරීමේ වියදම
(4) ස්ථාවර වත්කමක් අළුත්වැඩියා කිරීමේ පිරිවැය **(AAT - January 2015)**

06. (අ) පහත සඳහන් එක් එක් පදය පැහැදිලි කොට, ඒ සඳහා එක් උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

i. අයභාර ලැබීම්

ii. ප්‍රාග්ධන ලැබීම

(ආ) පහත සඳහන් එක් එක් අයිතමය ප්‍රාග්ධන වියදමක් ද අයභාර වියදමක් ද යන්න සඳහන් කරන්න.

i. නව යන්ත්‍රයක් ස්ථාපනය කිරීම සඳහා යෙදවූ කම්කරුවන්ට ගෙවූ වැටුප් - ............ .....................

ii. යන්ත්‍රයක ගෙවී ගිය කොටසක් ප්‍රතිසම්පාදනය කිරීමේ පිරිවැය - ...............................

iii. පරණ මෝටර් රථයක් සඳහා එය පාවිච්චි කිරීමට පෙර දරන ලද අළුත්වැඩියා වියදමක් - ..................................

iv. අළුත් අවුරුද්ද සඳහා කර්මාන්තශාලා ගොඩනැගිල්ල පින්තාරු කිරීම සඳහා දරන ලද පිරිවැය - ................................. **(A/L 2002 - 05 Marks)**

07. පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ප්‍රාග්ධන වියදම් වශයෙන් ගිණුම්ගත කළ යුතුද?

(1) කාර්යාල ගොඩනැගිල්ලේ බුමුතුරුණු ප්‍රතිසම්පාදන පිරිවැය.

(2) කාර්යාල ගොඩනැගිල්ලේ තීන්ත ගෑමේ පිරිවැය.

(3) නැවත විකිණීම සඳහා මිලදී ගත් පිරියත හා යන්ත්‍රෝපකරණ පිරිවැය.

(4) ඉහත දක්වා ඇති කිසිවක් එසේ ගිණුම්ගත කළ යුතු නොවේ. **(AAT - Dec 2009)**

# ගිණුම්කරණ සමීකරණ

ගිණුම්කරණ මූලිකාංගයන් ගණිතමය සමීකරණයන් ලෙස ඉදිරිපත් කිරීම ගිණුම්කරණ සමීකරණ නම් වේ.

## මූලික ගිණුම් සමීකරණය

**Basic Accounting Equation**

ව්‍යාපාරයක් සතු වත්කම් ද එම වත්කම් ලබා ගැනීමට ව්‍යාපාරයට මුදල් යෙදූ පාර්ශ්වයන්ට ඇති හිමිකම් හා බැඳීම් ද අතර වූ සම්බන්ධතාවය මූලික ගිණුම්කරණ සමීකරණය ලෙස හඳුන්වයි. මෙම සමීකරණයට අනුව ව්‍යාපාර ආයතනයක ඕනෑම අවස්ථාවක දී මුළු වත්කම් වල වටිනාකම හිමිකම් ඇතුළු මුළු වගකීම් වල වටිනාකමට සමාන විය යුතුය.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

මේ අනුව මූලික ගිණුම් සමීකරණය පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ හැකිය.

| | | | | |
|---|---|---|---|---|
| **හිමිකම්** | + | **වගකීම්** | = | **වත්කම්** |
| **Equities** | + | **Liabilities** | = | **Assets** |

මෙහි හිමිකම යන පදය වෙනුවට ප්‍රාග්ධනය හෝ අයිතිකරුවන්ගේ ස්කන්ධය යන පද භාවිතා කළ හැකිය.

ගිණුම්කරණ සමීකරණය ඉදිරිපත් කළ හැකි විවිධ ආකාර කිහිපයක්.

1. හිමිකම් = වත්කම් - වගකීම්
2. වගකීම් = වත්කම් - හිමිකම්
3. හිමිකම් + වගකීම් = ජංගම නොවන වත්කම් + ජංගම වත්කම්
4. හිමිකම් + ජංගම නොවන වගකීම් + ජංගම වගකීම් = වත්කම්
5. හිමිකම් + ජංගම නොවන වගකීම් + ජංගම වගකීම් = ජංගම නොවන වත්කම් + ජංගම වත්කම්
6. ලී බඩු + තොගය + ණයගැති + මුදල් = ණය හිමි + හිමිකම්

## අභ්‍යාසය 08

01. 2012 දෙසැම්බර් 01 දිනට ජැක්ගේ කේවලස්වාමී ව්‍යාපාරයෙන් පහත දැක්වෙන ශේෂ උපුටාගෙන ඇත.

| | රු. |
|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 850,000 |
| තොග | 200,000 |
| අතැති මුදල් | 250,000 |
| ණයහිමියෝ | 300,000 |
| උපචිත වියදම් | 100,000 |

ඉහත තොරතුරු පදනම් කොටගෙන, 2012 දෙසැම්බර් 01 දිනට **ජැක්ගේ** ව්‍යාපාරයේ ප්‍රාග්ධන ගිණුම් ශේෂය කුමක් ද?

(1) රු. 650,000/-  (2) රු. 900,000/-
(3) රු. 1,700,000/-  (4) මේ කිසිවක් නොවේ.

**(AAT - January 2013)**

02. පහත ඒවා අතුරෙන්, නිවැරදි සමීකරය තෝරන්න.

(1) වත්කම් = වියදම් + ප්‍රාග්ධනය
(2) වියදම් = වත්කම් - ප්‍රාග්ධනය
(3) ප්‍රාග්ධනය = වත්කම් + වගකීම්
(4) වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්  **(AAT - July 2012)**

# දළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් පිළියෙල කිරීම

කිසියම් නිශ්චිත ගිණුම් කාලපරිච්ඡේදයක් අවසාන වන දිනට ව්‍යාපාරය සතු වත්කම්, වගකීම් හා හිමිකම් අතර තිබෙන සම්බන්ධතාවය පෙන්නුම් කරන වාර්තාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය නම් වේ.

එය ගිණුමක් නොවන වාර්තාවකි. තිරස් හෝ සිරස් ආකෘතියකින් පිළියෙල කළ හැකිය.

**තිරස් ආකෘතිය** - (මෙය දළ ආකෘතියක් බව සලකන්න)

ABC ව්‍යාපාරය
........... දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | | |
|---|---|---|---|
| <u>හිමිකම් හා වගකීම්</u> | | <u>වත්කම්</u> | |
| <u>හිමිකම</u> | | <u>ජංගම නොවන වත්කම්</u> | |
| ප්‍රාග්ධනය | XX | ඉඩම් | XX |
| | | ගොඩනැගිලි | XX |
| | | යන්ත්‍ර සූත්‍ර | XX |
| | | මෝටර් රථ | XX |
| <u>ජංගම නොවන වගකීම්</u> | | <u>ජංගම වත්කම්</u> | |
| දිගුකාලීන බැංකු ණය | XX | වෙළඳ බඩු තොගය | XX |
| | | වෙළඳ ණයගැතියෝ | XX |
| | | බැංකු මුදල් | XX |
| | | අතැති මුදල් | XX |
| <u>ජංගම වගකීම්</u> | | | |
| වෙළඳ ණයහිමියෝ | XX | | |
| උපචිත වියදම් | XX | | |
| බැංකු අයිරාව | XX | | |
| | XX | | XX |

## සිරස් ආකෘතිය

ABC ව්‍යාපාරය

........... දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | | |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| ඉඩම් | XX | |
| ගොඩනැගිලි | XX | |
| යන්ත්‍ර සූත්‍ර | XX | |
| මෝටර් රථ | XX | XX |
| **ජංගම වත්කම්** | | |
| වෙළඳ බඩු තොගය | XX | |
| වෙළඳ ණයගැතියෝ | XX | |
| බැංකු මුදල් | XX | |
| අතැති මුදල් | XX | XX |
| | | XX |
| **හිමිකම් හා වගකීම්** | | |
| **හිමිකම** | | |
| ප්‍රාග්ධනය | | XX |
| **ජංගම නොවන වගකීම්** | | |
| දිගුකාලීන බැංකු ණය | | XX |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ණයහිමියෝ | XX | |
| උපචිත වියදම් | XX | |
| බැංකු අයිරාව | XX | XX |
| | | XX |

## සරල ලාභ හෝ අලාභ ප්‍රකාශයක් පිළියෙල කිරීම

කිසියම් නිශ්චිත ගිණුම් කාලච්ඡේදයක් තුළ ව්‍යාපාරයක් විසින් උපයා ඇති ශුද්ධ ආදායම (ලාභය හෝ අලාභය) ගණනය කිරීම සඳහා පිළියෙල කරනු ලබන වාර්තාව ලාභ හෝ අලාභ ප්‍රකාශය ලෙස හඳුන්වයි. සරල ලාභ හෝ අලාභ ප්‍රකාශයක ආකෘතිය පහත සඳහන් පරිදි වේ.

නව ගිණුම්කරණ ප්‍රමිත අනුව ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ලෙස හැඳින්වේ.

**භාණ්ඩ විකිණීමේ යෙදී සිටින ව්‍යාපාරයක ලාභ හෝ අලාභ ප්‍රකාශනය**

ලාභ හෝ අලාභ ප්‍රකාශය

| | | |
|---|---|---|
| විකුණුම් | | XX |
| අඩුකළා: විකුණුම් පිරිවැය | | (XX) |
| දළ ලාභය | | XX |
| (+) වෙනත් ආදායම් | | XX |
| | | XX |
| අඩුකළා: <u>වියදම්</u> | | |
| කුලී හා වරිපනම් | XX | |
| වේතන | XX | |
| විදුලිය ගාස්තු | XX | |
| දුරකථන ගාස්තු | XX | |
| ක්ෂය වීම් | XX | (XX) |
| ශුද්ධ ලාභය | | XX |

**විකුණුම් පිරිවැය ගණනය කරන ආකාරය**

| | | |
|---|---|---|
| ආරම්භක තොගය | | XXX |
| ගැනුම් | XXX | |
| (+) ගෙන ඒමේ කුලී | XXX | |
| | XXX | |
| (-) ආපසු යැවුම් | (XXX) | XXX |
| | | XXX |
| (-) භාණ්ඩ ගැනිලි | XXX | |
| තොග හානි | XXX | (XXX) |
| | | XXX |
| (-) අවසන් තොගය | | (XXX) |
| විකුණුම් පිරිවැය | | XXX |

**සේවා සපයන ව්‍යාපාරයක ලාභ හෝ අලාභ ප්‍රකාශනය**

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| | | |
|---|---|---|
| සේවා ආදායම් | | XX |
| අඩුකළා: වියදම් | | |
| කුලී හා වරිපනම් | XX | |
| වේතන | XX | |
| විදුලිය ගාස්තු | XX | |
| දුරකථන ගාස්තු | XX | |
| ක්ෂය වීම් | XX | (XX) |
| ශුද්ධ ලාභය | | XX |

## ලාභ හෝ අලාභ ප්‍රකාශයත් මූල්‍ය තත්ව ප්‍රකාශනයත් අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීම

ලාභ හෝ අලාභ ප්‍රකාශයකින් ගණනය කෙරෙන ශුද්ධ ආදායම හෝ ශුද්ධ ලාභය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ව්‍යාපාර හිමිකරුගේ ප්‍රාග්ධනයට එකතු කෙරේ. මේ අනුව ආදායම් හා වියදම් සම්බන්ධව කළ සමීකරණය පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ හැකිය.

ප්‍රාග්ධනය + (ආදායම් - වියදම්) + වගකීම් = වත්කම්

ප්‍රාග්ධනය + ආදායම් + වගකීම් = වත්කම් + වියදම්

## අභ්‍යාසය 09

ශ්‍යාමාගේ ව්‍යාපාරයේ 2019 දෙසැම්බර් මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

1. ශ්‍යාමා ප්‍රාග්ධනය ලෙස මුදලින් රු. 350,000 ක් යෙදා ව්‍යාපාරය ආරම්භ කිරීම
2. නැවත විකිණීම සඳහා වූ භාණ්ඩ අත්පිට ගැනුම් රු. 120,000
3. රු. 50,000 ක් වූ ලී බඩු උපකරණ ආයතනයේ පාවිච්චිය සඳහා මිලට ගැනීම
4. පිරිවැය රු. 60,000 ක් වූ භාණ්ඩ තොගයක් රු. 80,000 කට අත්පිට විකිණීම
5. පිරිවැය රු. 20,000 ක් වූ භාණ්ඩ තොගයක් රු. 28,000 කට ණයට විකිණීම
6. ව්‍යාපාරික ගොඩනැගිලි කුලිය රු. 10,000 මුදලින් ගෙවීම
7. ශ්‍යාමා ඇයගේ රු. 500,000 ක පෞද්ගලික වෑන් රථය ව්‍යාපාරයට අමතර ප්‍රාග්ධනය වශයෙන් යෙදවීම
8. ව්‍යාපාරික මුදලින් රු. 10,000 ක් ඇයගේ පෞද්ගලික වියදම් ගෙවීම සඳහා ලබා ගැනීම

**අවශ්‍ය වන්නේ,**

[ලී බඩු + රථ + ණයගැති + තොගය + මුදල් = ණයහිමි + හිමිකම]

## අභ්‍යාසය 10

නිමල්ගේ ව්‍යාපාරයේ 2019 දෙසැම්බර් මාසය සඳහා පහත ගනුදෙනු සපයා ඇත.

1. ප්‍රාග්ධනය ලෙස රු. 500,000 අයිතිකරු මුදලින් යෙදවීම
2. අත්පිට භාණ්ඩ ගැනුම් රු. 300,000
3. පාවිච්චිය සඳහා ලී බඩු උපකරණ මිල දී ගැනුම් රු. 30,000
4. පිරිවැය රු. 30,000 භාණ්ඩ රු. 35,000 කට අත්පිට විකිණීම
5. බැංකු ණය රු. 200,000 ලබා ගැනීම
6. රු. 150,000 ක භාණ්ඩ ණයට ගැනීම
7. රු. 80,000 ක භාණ්ඩ රු. 100,000 කට ණයට විකිණීම
8. රු. 100,000 බැංකු ස්ථාවර තැන්පතුවක මුදල් ආයෝජනය කිරීම
9. ව්‍යාපාරික මුදලින් රු. 10,000 අයිතිකරු විසින් පුද්ගලික ප්‍රයෝජනයට ගැනීම
10. ලද බැංකු පොලී ආදායම රු. 1,000 කි
11. විදුලි බිල රු. 5,000 ක් මුදලින් ගෙවීම
12. රු. 50,000 ක් මුදලින් ගෙවීම
13. බැංකු ණය වාරිකය රු. 30,000 ක් මුදලින් ගෙවීම. මෙහි අඩංගු බැංකු ණය පොලිය රු. 5,000කි.

**අවශ්‍ය වන්නේ,**

1. [ලී බඩු + ස්ථාවර තැන්පතු + ණයගැති + තොගය + මුදල් = ණයහිමි + බැංකුණය + හිමිකම]
2. [වත්කම් + වියදම් = වගකීම් + හිමිකම් + ආදායම]

## අභ්‍යාසය 11

ඉෂාර ට්‍රේඩර්ස්හි පොත්වලින් 2019 දෙසැම්බර් මාසය සඳහා පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

2019.12.01 ශේෂයන්

| | | | |
|---|---|---|---|
| ජංගම නොවන/ස්ථාවර වත්කම් | 100,000 | ප්‍රාග්ධනය | 195,000 |
| තොගය | 60,000 | ණයහිමියෝ | 60,000 |
| ණයගැතියෝ | 40,000 | මුදල් | 55,000 |

| | |
|---|---|
| 2019.12.02 | රු. 40,000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 60,000 කට ණයට විකිණීම |
| 2019.12.05 | රු. 50,000 ක් වටිනා භාණ්ඩ නැවත විකිණීම සඳහා ණයට ගන්නා ලදී |
| 2019.12.10 | ණයහිමියෙකුට රු. 30,000 ක් ගෙවන ලදී |
| 2019.12.12 | කාර්යාල වැටුප් ගෙවීම රු.40,000 |
| 2019.12.15 | ව්‍යාපාරයට අමතර ප්‍රාග්ධනය ලෙස රු. 10,000 ක් වටිනා ලී බඩු සහ රු. 50,000 ක මුදල් අයිතිකරු විසින් රැගෙන එන ලදි |
| 2019.12.25 | රු. 20,000 ක පිරිවැය වූ තොගයක් රු. 25,000 කට අත්පිට විකිණීම |
| 2019.12.28 | බැංකු පොලී ආදායම රු. 2,000 ක් ලැබීම |

ඉහත ගනුදෙනු

[ස්ථාවර වත්කම් + තොගය + ණයගැතියෝ + මුදල් = ප්‍රාග්ධනය + ණයහිමියෝ]

යන ගිණුම්කරණ සමීකරණයට බලපාන අන්දම ඉදිරිපත් කරන්න.

## අභ්‍යාසය 12

කේවලස්වාමී ව්‍යාපාරයක් වන සෑම් ට්‍රේඩර්ස් හි පොත්වලින් 2020 මාර්තු මාසය සඳහා වන පහත සඳහන් ගනුදෙනු උපුටාගෙන ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2020.03.02 | නැවත විකිණීම සඳහා රු. 450,000/- ක් වටිනා භාණ්ඩ ණය පදනම මත මිල දී ගන්නා ලදී. |
| 2020.03.05 | රු. 390,000/- ක් පිරිවැය වූ තොග රු. 445,000/- ක මුදලකට ණයට විකුණන ලදී. |
| 2020.03.10 | සෑම් විසින් රු. 38,500/- ක් පිරිවැය වූ භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගන්නා ලදී. |
| 2020.03.15 | සේවක වේතන වශයෙන් රු. 25,000/- ක් ගෙවන ලදී. |
| 2020.03.15 | බැංකුවේ ස්ථාවර තැන්පතුවක රු. 200,000/- ක මුදලක් ආයෝජනය කරන ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

[තොග + ණයගැතියෝ + ස්ථාවර තැන්පතුව + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්]

**(AAT - July 2020)**

## අභ්‍යාසය 13

ඒකලස්වාමී ව්‍යාපාරයක් වන ප්‍රනාන්දු ස්ටෝර්ස්හි පොත්වලින් 2019 මාර්තු මාසය සඳහා වන පහත සඳහන් ගනුදෙනු උපුටාගන්නා ලදී.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2019.03.01 | නැවත විකිණීම සඳහා රු. 825,000/- ක් වටිනා භාණ්ඩ ණය පදනම මත මිල දී ගන්නා ලදී. |
| 2019.03.05 | පිරිවැය රු. 420,000/- ක් වූ භාණ්ඩ, රු. 525,000/- කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2019.03.15 | ප්‍රනාන්දු විසින් තම පෞද්ගලික වියදම් සඳහා රු. 75,000/- ක මුදලක් ලබා ගන්නා ලදී. |
| 2019.03.26 | ණය පදනම යටතේ මිල දී ගත් භාණ්ඩ සඳහා ණයහිමියන්ට රු. 95,000/- ක් ගෙවන ලදී. |
| 2019.03.30 | රු. 100,000/- ක කාර්ය මණ්ඩල වැටුප් ගෙවන ලදී. |
| 2019.03.31 | කාර්යාල ප්‍රයෝජනය සඳහා රු. 1,500,000/- ක් වටිනා ලී බඩු, ණය පදනම මත මිල දී ගන්නා ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ:

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

[ජංගම නොවන වත්කම (ස්ථාවර වත්කම්) + තොග + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්]

**(AAT - January 2020)**

## අභ්‍යාසය 14

ඒකලස්වාමී ව්‍යාපාරයක් වන සමන් ට්‍රේඩර්ස්හි පොත්වලින් 2019 ජනවාරි මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටා ගන්නා ලදී.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2019.01.02 | නැවත විකිණීම සඳහා රු. 723,000/- ක් වටිනා භාණ්ඩ, ණයට මිල දී ගන්නා ලදී. |
| 2019.01.05 | අයිතිකරු වන සමන්, පිරිවැය රු, 50,000/- ක් වූ භාණ්ඩ ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබා ගන්නා ලදී. |
| 2019.01.10 | පිරිවැය රු. 575,000/- ක භාණ්ඩ, රු. 600,000/- කට ණයට විකුණන ලදී. |
| 2019.01.15 | ණයගැතියන්ගෙන් රු. 550,000/- ක මුදලක් ලැබුණි. |
| 2019.01.28 | 2019 ජනවාරි මාසයේ දුරකතන බිල්පත රු. 18,000/- ක් වූ අතර, රු. 12,000/- ක් පමණක් ගෙවන ලදී. |
| 2019.01.30 | රු. 500,000/- ක මෝටර් සයිකලයක් කාර්යාලයේ භාවිතය සඳහා අත්පිට මුදලට මිල දී ගන්නා ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ,

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

[ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + ණයගැතියෝ + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්]

**(AAT July 2019)**

## අභ්‍යාසය 15

විජේසූරිය 2018 සැප්තැම්බර් 01 දින කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළේය. පහත සඳහන් ගනුදෙනු 2018 සැප්තැම්බර් මාසය සඳහා ඔහුගේ ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලදී.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2018.09.01 | මුදලින් රු. 800,000/- ක් ආයෝජනය කරමින් විජේසූරිය ව්‍යාපාරය ආරම්භ කළේ ය. තවද, ඔහු රු. 1,500,000/- ක් වටිනා ඔහුගේ පෞද්ගලික වෑන් රථය ව්‍යාපාරයේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආයෝජනය කළේ ය. |
| 2018.09.05 | නැවත විකිණීම සඳහා රු. 625,000/- ක් වටිනා භාණ්ඩ ණයට මිල දී ගත්තේය. |
| 2018.09.18 | රු. 375,000/- ක් පිරිවැය වූ භාණ්ඩ, රු. 485,000/- කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2018.09.26 | රු. 125,000/- ක සේවක වැටුප් ගෙවන ලදී. |
| 2018.09.28 | විජේසූරිය විසින් ඔහුගේ පෞද්ගලික පරිහරණය සඳහා රු. 35,000/- ක මුදලක් ව්‍යාපාරයෙන් ලබා ගන්නා ලදී. |
| 2018.09.30 | ණයට ලබාගත් භාණ්ඩ වෙනුවෙන් ණයහිමියන්ට රු. 125,000/- ක් ගෙවන ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ,

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

[ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + මුදල් = ස්කන්ධය (හිමිකම) + වගකීම්]

**(AAT - January 2019)**

## අභ්‍යාසය 16

කේවලස්වාමි ව්‍යාපාරයක් වන මල්ටි ට්‍රේඩර්ස්හි පොත්වලින් 2018 ජනවාරි මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටාගෙන ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2018.01.05 | පිරිවැය රු. 150,000/- ක් වූ භාණ්ඩ තොගයක් රු. 170,000/- කට ණය පදනම මත රත්න ට්‍රේඩර්ස් වෙත විකුණන ලදී. |
| 2018.01.20 | රු. 100,000/- ක මුදලක් රත්න ට්‍රේඩර්ස් වෙතින් ලැබුණි. |
| 2018.01.22 | නැවත විකිණීම සඳහා රු. 200,000/- ක වටිනා භාණ්ඩ අත්පිට මුදලට මිලට ගන්නා ලදී. |
| 2018.01.27 | අයිතිකරු රු. 1,000,000/- ක මුදලක් අමතර ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට ආයෝජනය කරන ලදී. |
| 2018.01.31 | ජනවාරි මාසය සඳහා සේවක වැටුප් රු. 125,000/- ක් ගෙවන ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ,

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

[තොග + ණයගැතියෝ + මුදල් = හිමිකම + වගකීම්] **(AAT July 2018)**

## අභ්‍යාසය 17

කේවලස්වාමි ව්‍යාපාරයක් වන ටිකිරි ට්‍රේඩර්ස්හි පොත්වලින් 2017 නොවැම්බර් මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටාගෙන ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2017.11.01 | රු. 650,000/- ක් වටිනා භාණ්ඩ නැවත විකිණීම සඳහා ණයට මිල දී ගන්නා ලදී. |
| 2017.11.05 | රු. 750,000/- ක් කෙටිකාලීන ණයක් ABC බැංකුවෙන් ලබා ගත්තේය. |
| 2017.11.20 | ටිකිරි ට්‍රේඩර්ස් හි අයිතිකරු විසින් රු. 30,000/- ක් පිරිවැය වූ භාණ්ඩ ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගන්නා ලදී. |
| 2017.11.25 | 2017 නොවැම්බර් මාසයේ දුරකතන බිල රු. 5,000/- ක් විය. නමුත් මාසය තුළ දී රු. 4,000/- ක් පමණ ගෙවා ඇත. |
| 2017.11.28 | රු. 200,00/- ක් පිරිවැය වූ භාණ්ඩ රු. 220,000/- කට ණය පදනම මත විකුණන ලදී. |
| 2017.11.30 | ණයට ගත් භාණ්ඩ සඳහා ණයහිමියෙකුට රු. 300,000/- ක් ගෙවන ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ,

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

(තොග + ණයගැතියෝ + මුදල් = හිමිකම (ස්කන්ධය) + වගකීම්) **(AAT January 2018)**

## අභ්‍යාසය 18

කේවල ස්වාමි ව්‍යාපාරිකයෙකු වූ රෝස්ගේ ව්‍යාපාරයේ පොත්වලින් 2017 මාර්තු මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටාගන්නා ලදී.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2017.03.01 | රු. 500,000/- ක් මුදලින් ආයෝජනය කර රෝස් ව්‍යාපාරය ආරම්භ කරන ලදී. |
| 2017.03.05 | නැවත විකිණීම සඳහා රු. 750,000/- ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. |
| 2017.03.15 | රු. 300,000/- ක පිරිවැය වූ තොග, පිරිවැය මත 10% ක ලාභ ආන්තිකයක් සහිතව මුදලට විකුණන ලදී. |
| 2017.03.20 | සැපයුම්කරුවෙකුට රු. 200,000/- ක් ගෙවන ලදී. |
| 2017.03.25 | 2017 මාර්තු මාසය සඳහා රු. 10,000/- ක විදුලි බිල්පත ගෙවන ලදී |
| 2017.03.31 | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා ණය පදනම මත රු. 100,000/- කට පරිගණකයක් මිලදී ගන්නා ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ,

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

[ජංගම නොවන වත්කම් (ස්ථාවර වත්කම්) + තොග + ණයගැතියෝ + මුදල් = හිමිකම + වගකීම්]

**(AAT July 2017)**

## අභ්‍යාසය 19

මැතිව්ස් ට්‍රේඩර්ස් හි පොත් වලින් 2016 ජුනි මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටා ගන්නා ලදී.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2016.06.01 | රු. 40,000/- ක් පිරිවැය වූ භාණ්ඩ ණය පදනම මත රු. 60,000 කට විකුණන ලදී. |
| 2016.06.07 | රු. 50,000/- ක් වටිනා භාණ්ඩ නැවත විකිණීම සඳහා ණය පදනම මත මිලට ගන්නා ලදී. |
| 2016.06.08 | ණයට මිලදී ගත් භාණ්ඩ සඳහා ණයහිමියෙකුට රු. 10,000/- ක් ගෙවන ලදී. |
| 2016.06.24 | ජුනි මාසය සඳහා කාර්ය මණ්ඩල වැටුප් රු. 45,000/- ක් ගෙවන ලදී |
| 2016.06.30 | ව්‍යාපාරයට අතිරේක ප්‍රාග්ධනය වශයෙන් රු. 90,000/- ක් මැතිව්ස් විසින් මුදලින් ආයෝජනය කරන ලදී |
| 2016.06.30 | කාර්යාලයේ භාවිතය සඳහා සීමාසහිත කුරේ සමාගමෙන් ණය පදනම මත රු. 10,000 ක කාර්යාල උපකරණයක් මිලදී ගන්නා ලදී. |

ඔබ විසින් කළ යුතු දෑ,

ඉහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම සටහන් කරන්න.

[ස්ථාවර වත්කම් + තොග + ණයගැතියෝ + මුදල් = ප්‍රාග්ධනය + වගකීම්] **(AAT January 2017)**

## අභ්‍යාසය 20

2015 ජනවාරි 01 දින **සනත්** කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, ව්‍යාපාරයේ පළමු දෙසතිය තුල සිදුකරන ලද ගනුදෙනු පහත දක්වා ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2015.01.01 | බැංකු ජංගම ගිණුමක රු. 950,000/- ක් තැන්පත් කර සනත් ව්‍යාපාරය ආරම්භ කළ අතර රු.250,000/- ක් වටිනා භාණ්ඩ අත්පිට මුදලට මිලදී ගන්නා ලදී. |
| 2015.01.02 | රු. 12,000/- ක් වූ ව්‍යාපාරය ආරම්භ කිරීමේ වියදම් මුදලින් ගෙවන ලදී. |
| 2015.01.03 | නැවත විකිණීම සඳහා රු.350,000/- ක භාණ්ඩ ණය පදනම මත මිලදී ගත් අතර රු. 10,000/- ක ප්‍රවාහන පිරිවැයක් දරණ ලදී. |
| 2015.01.07 | 25% ක ලාභ ආන්තිකයක් ඇතුලත් අත්පිට මුදලට විකුණුම් රු. 40,000/- කි. |
| 2015.01.10 | රු.75,000/- ක සේවක වැටුප් ගෙවන ලදී. රු. 10,000/- ලාභයක් ඇතුලත් රු.100,000/- ක භාණ්ඩ ණය පදනම මත විකුණන ලදී. |
| 2015.01.12 | සනත් විසින් ඔහුගේ පෞද්ගලික ගෙවල් කුලී වියදම් රු.50,000/- ක් ව්‍යාපාර-යෙන් ගෙවන ලදී. |

ඔබ විසින්,

ඉහත ගනුදෙනුවල බලපෑම, පහත දැක්වෙන ගිණුම්කරණ සමීකරණයේ සටහන් කරන්න.
[තොග + ණයගැතියෝ + මුදල් = ප්‍රාග්ධනය + වගකීම් + (ආදායම් - වියදම්)]

**(AAT - July 2015 - 08 Marks)**

## අභ්‍යාසය 21

කේවලස්වාමි ව්‍යාපාරිකයෙකු වන නාමල්ගේ ව්‍යාපාරයේ පොත්වලින් 2014 මාර්තු මාසය තුල පහත සඳහන් ගනුදෙනු උපුටා ගන්නා ලදී.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2014.03.01 | මුදලින් රු.2,500,000/- ක් යොදා නාමල්, ව්‍යාපාරයක් ආරම්භ කළේය. |
| 2014.03.02 | නැවත විකිණීම සඳහා රු.1,000,000/- ක භාණ්ඩ ණයට මිලදී ගත්තේය. |
| 2014.03.10 | පිරිවැයට 30% ක ආන්තිකයක් සහිතව රු.250,000/- ක පිරිවැය වූ තොග ණයට විකුණා ඇත. |
| 2014.03.18 | ගනුදෙනුකරුවෙකුගෙන් රු.200,000/- ක් එකතු කර ගත්තේය. |
| 2014.03.25 | රු.300,000/- ක කාර්ය මණ්ඩල වැටුප් ගෙවන ලදී. |
| 2014.03.28 | පිරිවැය රු.125,000/- ක් වූ භාණ්ඩ තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා නාමල් ලබා ගනී. |
| 2014.03.30 | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා රු.850,000/- කට බෙදාහැරීමේ වෑන් රථයක් මුදලට ගනී. |

ඔබ විසින්,
ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට, බලපාන ආකාරය පෙන්නුම් කළ යුතුය.
[ස්ථාවර වත්කම් + තොග + ණයගැතියන් + මුදල් = ප්‍රාග්ධනය + වගකීම් ]

**(AAT - January 2015 - 07 1/2 Marks)**

## අභ්‍යාසය 22

2013 ඔක්තෝම්බර් 01 දින අමල් සාප්පුවක් ආරම්භ කළේය. ඔහුගේ ව්‍යාපාරයේ පළමු මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2013.10.01 | රු. 85,000/- ක් මුදලින් යොදා අමල් ව්‍යාපාරය ඇරඹීය. |
| 2013.10.07 | දින 30 ක් ඇතුලත පියවිය යුතු ණයට ගැනුම් රු. 35,000/- ක් විය. |
| 2013.10.12 | සාප්පුවේ පළමු මාසයේ කුලිය වශයෙන් රු. 8,000/- ක් ගෙවීම. |
| 2013.10.17 | රු. 11,000/- ක භාණ්ඩ විකුණා, රු. 4,000/- ක් මුදලින් එකතුකර ගැනීම, විකුණූ භාණ්ඩවල පිරිවැය රු. 9,000/- කි. |
| 2013.10.18 | රු. 2,500/- ක් පිරිවැය වූ භාණ්ඩ අමල්ගේ පෞද්ගලික පරිහරණයට යොදා ගැනීම. |
| 2013.10.25 | ණයගැතියෙකුගෙන් රු. 6,000/- ක් එකතු කර ගැනීම. |
| 2013.10.28 | ණයට මිල දී ගත් භාණ්ඩ සඳහා ණයහිමියෙකුට රු. 5,000/- ක් ගෙවීම. |
| 2013.10.31 | ණයට ගැනුම් රු. 10,000/- ක් වූ අතර, අත්පිට මුදලට ගැනුම් රු. 20,000/- ක් විය. |

ඔබ විසින් කළ යුතු දෑ,
(a) ඉහත සඳහන් ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පෙන්වන්න.
(තොග + ණයගැතියෝ + මුදල් = ප්‍රාග්ධනය + වගකීම්)
(b) 2013 ඔක්තෝම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) පිළියෙල කරන්න.

**(AAT - July 2014 - 13 Marks)**

## අභ්‍යාසය 23

සිල්වා බේක් හවුස් ව්‍යාපාරයේ සමහර ගනුදෙනු වලින් ගිණුම්වලට වන බලපෑම (impact) පහත පරිදි විය.

| අයිතමය | මුදල් රු. | තොග රු. | ලැබිය යුතු මුදල් රු. | ප්‍රාග්ධනය රු. | ස්ථාවර වත්කම් රු. | ආදායම රු. | වියදම් රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | + 5,000 | - 3,000 | - | - | - | + 5,000 | + 3,000 |
| 2 | + 3,000 | - | - | + 6,000 | + 3,000 | - | - |
| 3 | - | - 500 | - | - | + 500 | - | - |
| 4 | - | - 4,000 | - | - 4,000 | - | - | - |
| 5 | - | - | - | + 300 | - | - | + 300 |
| 6 | - | - | - | - | - 700 | - | + 700 |
| 7 | + 1,000 | - 3,000 | + 3,000 | - | - | + 4,000 | + 3,000 |
| 8 | + 2,000 | - | - 2,100 | - | - | - | + 100 |

ඔබ විසින්, ඉහත 2 සිට 8 හි සඳහන් එක් එක් බලපෑමට හේතුවිය හැකි, ගනුදෙනුවල ස්වභාවය විස්තර කරන්න.

(ඉහත 1 අයිතමය සඳහා උදාහරණය පහත දැක්වේ:
ගනුදෙනුව: පිරිවැය රු. 3,000 ක් වූ භාණ්ඩ රු. 5,000 ක් අත්පිට මුදලට විකිණීම.)

**(AAT - December 2010 - 08 Marks)**

## අභ්‍යාසය 24

මොහාන්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය ඇසුරින් පහත දක්වා ඇත.

| | අයිතිකරුගේ ප්‍රාග්ධනය | + වගකීම් | = වත්කම් |
|---|---|---|---|
| i. | වැඩිවීම | | වැඩිවීම (මුදල්) |
| ii. | අඩුවීම | වැඩිවීම(ණයහිමියෝ) | |
| iii. | අඩුවීම | | අඩුවීම (මුදල්) |
| iv. | වැඩිවීම | | වැඩිවීම (ණයගැතියෝ) |
| v. | අඩුවීම | | අඩුවීම (තොගය) |
| vi. | අඩුවීම | | අඩුවීම (ස්ථාවර වත්කම්) |

කාලච්ඡේදය තුළ දී අයිතිකරු විසින් මුදලින් ප්‍රාග්ධනයට එකතු කිරීමක් හෝ මුදලින් ප්‍රාග්ධනය ආපසු ගැනීමක් සිදු නොවින.
අවශ්‍ය වන්නේ,

සිදු වී ඇතැයි සැලකිය හැකි එක් එක් ව්‍යාපාර ගනුදෙනුව විස්තර කරන්න.

**(A/L 2001 - 03 Marks)**

## අභ්‍යාසය 25

2000 ජනවාරි 01 දින කමල් සේවා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ජනවාරි මාසයට අදාළ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් පහත දක්වා ඇත.

| ගනුදෙනුව | මුදල් | + ණයගැතියෝ | + කාර්යාල ලිපිද්‍රව්‍ය | + ලී බඩු | = | ණයහිමියෝ | + ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|---|
| 1 | + 60 000 | | | | = | | + 60 000 |
| 2 | - 2 000 | | + 3 500 | | = | + 1 500 | |
| 3 | - 16 000 | | | + 16 000 | = | | |
| 4 | + 6 000 | + 5 000 | | | = | | + 11 000 |
| 5 | - 3 500 | | | | = | | - 3 500 |
| 6 | - 1 000 | | | | = | - 1 000 | |
| 7 | | | - 1 500 | | = | | - 1 500 |
| 8 | - 5 000 | | | | = | | - 5 000 |

ගනුදෙනු අංක 4, 5 සහ 7 පමණක් ශුද්ධ ලාභයට බලපා ඇත.

අවශ්‍ය වන්නේ:

එක් එක් ගනුදෙනුව එහි වටිනාකම සමග විස්තර කරන්න. **(A/L 2000)**

## අභ්‍යාසය 26

ප්‍රවාහන සේවා ආයතනයක සංක්ෂිප්ත දත්තයන් පහත දැක්වේ. ඔබ විසින් මෙහි ඇතුළත් එක් එක් ගනුදෙනු විස්තර කළ යුතු වේ.

| | ප්‍රාග්ධනය | + | ණයහිමියෝ | = | මුදල් | + | තොග | + | මෝටර් වාහන |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | + 270 000 | | | | + 40 000 | | + 55 000 | | + 175 000 |
| 2 | | | + 160 000 | | - 30 000 | | | | + 190 000 |
| 3 | + 20 000 | | | | + 60 000 | | - 40 000 | | |
| 4 | | | - 15 000 | | - 15 000 | | | | |
| 5 | - 3 250 | | | | | | - 3 250 | | |

## අභ්‍යාසය 27

01. කේවලස්වාමී ව්‍යාපාරයක අයිතිකරු විසින් තම පෞද්ගලික මෝටර් වැන් රථය තම ව්‍යාපාරයට පැවරීම තුළින් ගිණුම්කරණ සමීකරණයට ඇති කරනු ලබන නිවැරදි බලපෑම, පහත ඒවා අතුරෙන් තෝරන්න.
    (1) ස්කන්ධය (හිමිකම) වැඩි වීම සහ වත්කම් අඩු වීම
    (2) වත්කම් වැඩි වීම සහ ස්කන්ධය (හිමිකම) අඩු වීම
    (3) වගකීම් වැඩි වීම සහ ස්කන්ධය (හිමිකම) අඩු වීම
    (4) වත්කම් වැඩි වීම සහ ස්කන්ධය (හිමිකම) වැඩි වීම **(AAT - July 2020)**

02.

| වත්කම් | = | ස්කන්ධය (හිමිකම) | + | වගකීම් |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 150,000 | = | 150,000 | + | - |
| (140,000) | | (140,000) | | |

පහත සඳහන් ඒවා අතුරෙන්, ඉහත ගිණුම්කරණ සමීකරණය සඳහා වඩාත් නිවැරදි ගනුදෙනුව වන්නේ කුමක් ද?

(1) පිරිවැය රු. 140,000/- ක් වූ භාණ්ඩ රු. 150,000/- කට විකුණන ලදී
(2) පිරිවැය රු. 150,000/- ක් වූ භාණ්ඩ රු. 140,000/- කට විකුණන ලදී
(3) රු. 150,000/- ක භාණ්ඩ, ණය පදනම මත විකුණා රු. 140,000/- ක මුදලක් එකතු කර ගන්නා ලදී
(4) රු. 150,000/- ක භාණ්ඩ, ණය පදනම මත මිල දී ගෙන රු. 140,000/- ක් ගෙවන ලදී

**(AAT - January 2020)**

03. අයිතිකරු විසින් ආයෝජනය කළ අමතර ප්‍රාග්ධනය හේතුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම තෝරන්න.

(1) වත්කම් අඩු වීම සහ ස්කන්ධය අඩු වීම
(2) වත්කම් වැඩි වීම සහ ස්කන්ධය අඩු වීම
(3) වත්කම් වැඩි වීම සහ ස්කන්ධය වැඩි වීම
(4) වත්කම් අඩු වීම සහ ස්කන්ධය වැඩි වීම **(AAT - July 2019)**

04. ණයහිමියෙකුට මුදලින් පියවීම නිසා ගිණුම්කරණ සමීකරණයට වන නිවැරදි බලපෑම, පහත සඳහන් ඒවා අතුරෙන් තෝරන්න.

(1) වත්කම් අඩු වීම සහ වගකීම් අඩු වීම
(2) වත්කම් අඩු වීම සහ වගකීම් වැඩි වීම
(3) වගකීම් අඩු වීම සහ ස්කන්ධය අඩු වීම
(4) වගකීම් අඩු වීම සහ ස්කන්ධය වැඩි වීම **(AAT - January 2019)**

05. 2018 අප්‍රේල් 01 දින, ධනපාල ෆර්නිචර් වෙතින් රු. 45,000/- ක් වටිනා කාර්යාල අල්මාරියක් කාර්යාලයේ භාවිතය සඳහා සහන් විසින් ණයට මිලට ගන්නා ලදී.
ඉහත ගනුදෙනුවෙන් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ,

(1) වත්කම් වැඩි වීම සහ වගකීම් අඩුවීම
(2) හිමිකම අඩු වීම සහ වගකීම් අඩුවීම
(3) වත්කම් වැඩි වීම සහ වගකීම් වැඩිවීම
(4) හිමිකම් අඩු වීම සහ වගකීම් වැඩිවීම **(AAT - July 2018)**

06. පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, හිමිකමේ වැඩිවීමක් සඳහා බලපාන ගනුදෙනුව කුමක් ද?

(1) රු. 300,000/- ක කෙටිකාලීන ණයක් බැංකුවකින් ලබා ගැනිම

(2) වෙළෙඳ ණයගැතියෙකුගේ රු. 150,000/- ක් ලැබීම

(3) ඉදිරි වර්ෂයේ ගොඩනැගිලි කුලිය සඳහා රු. 560,000/- ක අත්තිකාරමක් ලැබීම

(4) අයිතිකරු විසින් මුදලින් රු. 150,000/- ක් ව්‍යාපාරයට යෙදවීම **(AAT - July 2018)**

07. පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, වගකීම් අඩු වීමට බලපාන්නේ කුමක් ද?

(1) ABC ටෙක්ස්ටයිල් වෙතින් රු. 150,000/- ක අමුද්‍රව්‍ය ණයට මිල දී ගැනීම

(2) MKK ෆැෂන්ස් වෙත රු. 850,000/- ක ඇඟළුම් මාස තුනක ණය පදනමට විකිණීම

(3) රු. 755,000/- ක කෙටිකාලීන ණයක් UE බැංකුවට පියවීම

(4) ඊළඟ වර්ෂයේ ගොඩනැගිලි කුලිය සඳහා රු. 500,000/- ක අත්තිකාරමක් ගෙවීම

**(AAT - January 2018)**

08. බැංකුවෙන් ලබාගන්නා ලද කෙටිකාලීන ණයක් පියවීමෙන්, ව්‍යාපාරය කෙරෙහි ඇති කෙරෙන බලපෑම නිවැරදි ලෙස සඳහන් වන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශනයේද?

(1) වත්කම් වැඩිවීම සහ ප්‍රාග්ධනය වැඩිවීම (2) වත්කම් අඩුවීම සහ වගකීම් වැඩිවීම

(3) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම (4) වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම

**(AAT - July 2017)**

09. පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳ ණයගැතියෙකුගෙන් මුදල් ලැබීම නිසා ගිණුම්කරණ මූලිකාංග (Accounting elements) කෙරෙහි වන නිවැරදි බලපෑම තෝරන්න

(1) වත්කම් වැඩිවීම සහ වගකීම් වැඩිවීම

(2) වත්කම් අඩුවීම සහ වගකීම් අඩුවීම

(3) වත්කම් අඩුවීම සහ ප්‍රාග්ධනය අඩුවීම

(4) වත්කම් වල වෙනසක් සිදු නොවේ **(AAT - January 2017)**

# ලාභ සමීකරණය

ව්‍යාපාර ආයතනයක් විසින් ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ දී උපයන ලද ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරනුයේ එම ගිණුම් කාලපරිච්ඡේදයේ ආදායම් වලින් වියදම අඩු කිරීමෙනි. මේ සඳහා ආදායම් ප්‍රකාශනයක් හෝ ලාභාලාභ ගිණුමක් පිළියෙල කරනු ලැබේ.

එහෙත් නිසියාකාරව ගිණුම් නොතබන ව්‍යාපාරයක ගිණුම් කාලච්ඡේදයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ මුල්‍යමය තොරතුරු ලබාගත නොහැකි අවස්ථාවක ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කර ගැනීම සඳහා ආදායම් ප්‍රකාශයක් හෝ ලාභාලාභ ගිණුමක් පිළියෙල කළ නොහැකිය. එවැනි අවස්ථාවක ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය ගණනය කර ගැනීම සඳහා විකල්ප ක්‍රමයක් ලෙස ලාභ සමීකරණය යොදාගත හැකිය.

ලාභ සමීකරණයෙන් සිදු කරන්නේ ගිණුම් කාලච්ඡේදයේ ආරම්භක ප්‍රාග්ධනය (ශුද්ධ වත්කම්) හා අවසාන ප්‍රාග්ධනය (ශුද්ධ වත්කම්) සැසඳීමෙන් හා ප්‍රාග්ධනයේ වෙනස් වීමට බලපෑ ශුද්ධ ලාභයට අදාළ නොවූ අතිරේක ප්‍රාග්ධන යෙදවීම් හා ගැනිලි ආපසු ගැලපීමෙන් ශුද්ධ ලාභය හෝ ශුද්ධ අලාභය ගණනය කිරීමයි.

මේ අනුව ලාභ සමීකරණය පහත සඳහන් පරිදි ඉදිරිපත් කළ හැකිය.

..........................................................................................................................................

..........................................................................................................................................

මෙහි ශුද්ධ වත්කම් යනු ප්‍රාග්ධනය යි / හිමිකම යි.

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | + | වගකීම් | = | වත්කම් |
| ප්‍රාග්ධනය | = | වත්කම් | - | වගකීම් |
| ප්‍රාග්ධනය | = | ශුද්ධ වත්කම් | | |

## අභ්‍යාසය 28

01. කේවලස්වාමී (තනි පුද්ගල) ව්‍යාපාරයක් වන රුවන් ට්‍රේඩර්ස්හි පොත්වලින්, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු. |
|---|---|
| 2020 මාර්තු 31 දිනට මුළු වත්කම් | 1,550,000 |
| 2020 මාර්තු 31 දිනට වගකීම් | 750,000 |
| 2019 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | 280,000 |
| වර්ෂය තුළ සිදු කළ ගැනිලි | 150,000 |

2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය වන්නේ,

(1) රු. 670,000/- කි
(2) රු. 800,000/- කි
(3) රු. 370,000/- කි
(4) රු. 930,000/- කි **(AAT - July 2020)**

02. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සරසි ට්‍රේඩර්ස්හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී

| විස්තරය | රු. |
|---|---|
| 2018 අප්‍රේල් 01 දිනට ශුද්ධ වත්කම් | 975,000 |
| 2019 මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් | 1,350,000 |
| වර්ෂය තුළ දී අයිතිකරු විසින් හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 500,000 |
| වර්ෂය තුළ දී අයිතිකරු විසින් සිදු කළ ගැනිලි | 350,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ලාභය වන්නේ,

(1) රු. 525,000/-
(2) රු. 225,000/-
(3) රු. 1,475,000/-
(4) රු. 375,000/- **(AAT - January 2020)**

03. පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක ලාභය ගණනය කිරීමට අදාළ නිවැරදි සමීකරණය වන්නේ,

(1) අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි + අතිරේක ප්‍රාග්ධනය
(2) අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් + ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය
(3) ආරම්භක ශුද්ධ වත්කම් - අවසාන ශුද්ධ වත්කම් - ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය
(4) ආරම්භක ශුද්ධ වත්කම් + අවසාන ශුද්ධ වත්කම් - ගැනිලි - අතිරේක ප්‍රාග්ධනය

**(AAT - July 2019)**

04. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු, මුන් ලංකා ට්‍රේඩර්ස්හි පොත්වලින් උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 750,000 |
| වර්ෂය තුළ දී හඳුන්වා දුන් අමතර ප්‍රාග්ධනය | 50,000 |
| 2018 මාර්තු 31 දිනට වගකීම් | 75,000 |
| 2018 මාර්තු 31 දිනට මුළු වත්කම් | 987,000 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය වන්නේ,

(1) රු. 112,000/- (2) රු. 237,000/-
(3) රු. 187,000/- (4) රු. 162,000/- **(AAT - January 2019)**

05. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රෝස් ට්‍රේඩර්ස්හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| විස්තරය | රු. |
|---|---|
| 2017 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 500,000 |
| 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 175,000 |
| 2018 මාර්තු 31 දිනට වගකීම් | 425,000 |
| වර්ෂය තුළ ගැනිලි | 25,000 |

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

2018 මාර්තු 31 දිනට රෝස් ට්‍රේඩර්ස්හි මුළු වත්කම්වල වටිනාකම ගණනය කරන්න.

**(AAT - July 2018)**

06. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමන් ට්‍රේඩර්ස්හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| විස්තරය | රු. |
|---|---|
| 2016 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 550,000 |
| 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 155,000 |
| වර්ෂය තුළ දී ගැනිලි | 350,000 |
| වර්ෂය තුළ දී හඳුන්වා දුන් අමතර ප්‍රාග්ධනය | 200,000 |
| 2017 මාර්තු 31 දිනට වගකීම් | 300,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2017 මාර්තු 31 දිනට සමන් ට්‍රේඩර්ස්හි මුළු වත්කම්වල වටිනාකම වන්නේ,

(1) රු. 1,155,000/- (2) රු. 705,000/-
(3) රු. 1,555,000/- (4) රු. 855,000/- **(AAT - January 2018)**

07. පියල් ඔප්ටිකල්ස් හි පොත්වලින්, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| | රු. |
|---|---:|
| 2017 ජනවාරි 01 දිනට ශුද්ධ වත්කම් | 525,000 |
| 2017 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් | 850,000 |
| වර්ෂය තුළ දී අයිතිකරු විසින් සිදුකළ ගැනිලි | 150,000 |
| වර්ෂය තුළ දී හඳුන්වා දුන් අමතර ප්‍රාග්ධනය | 250,000 |

පියල් ඔප්ටිකල්ස්හි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය, "ලාභ සමීකරණය" භාවිත කරමින් ගණනය කරන්න. **(AAT - January 2018)**

08. 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, කපිල මෝටර්ස්හි පොත්වලින්, පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---:|
| 2016.04.01 දිනට ශුද්ධ වත්කම් | 325,000 |
| 2017.03.31 දිනට ශුද්ධ වත්කම් | 385,000 |
| වර්ෂය තුළ ගැනිලි (drawings) | 35,000 |
| වර්ෂය තුළ හඳුන්වා දුන් අතිරේක ප්‍රාග්ධනය | 10,000 |

ඉහත සඳහන් තොරතුරු වලට අනුව, 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය) වන්නේ,

(1) (රු. 105,000)
(2) (රු. 35,000)
(3) රු. 85,000/-
(4) රු. 15,000/- **(AAT - July 2017)**

09. පහත සඳහන් තොරතුරු ABC එන්ටප්‍රයිසස් හි පොත් වලින් උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---:|
| 2015 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 200,000 |
| වර්ෂය තුළ ගැනිලි | 120,000 |
| 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට | 145,000 |
| 2016 මාර්තු 31 දිනට වගකීම් | 12,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2016 මාර්තු 31 දිනට මුළු වත්කම් වන්නේ,

(1) රු. 305,000/- කි.
(2) රු. 545,000/- කි.
(3) රු. 345,000/- කි.
(4) රු. 225,000/- කි. **(AAT - January 2017)**

10. පහත සඳහන් තොරතුරු XYZ ට්‍රේඩර්ස් හි පොත් වලින් උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---:|
| 2015 අප්‍රේල් 01 දිනට ශුද්ධ වත්කම් | 150,000 |
| අතිරේක ප්‍රාග්ධනය | 25,000 |
| 2016 මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් | 135,000 |
| වර්ෂය තුළ අයිතිකරුගේ ගැනිලි | 12,000 |

ලාභ සමීකරණයට භාවිතා කරමින්, 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා XYZ ට්‍රේඩර්ස් හි ශුද්ධ ලාභය / (අලාභය) වන්නේ,

(1) (රු. 22,000/-) කි.
(2) රු. 28,000 කි.
(3) රු. 52,000/- කි.
(4) (රු. 28,000/-) කි. **(AAT - January 2017)**

11. කේවල ස්වාමි ව්‍යාපාරයක් වන ABC එන්ටප්‍රයිසස් හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු. |
|---|---:|
| 2015 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 200,000 |
| වර්ෂය තුළ ගැනිලි | 120,000 |
| 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට ලාභය | 145,000 |
| 2016 මාර්තු 31 දිනට වගකීම් | 80,000 |

ඉහත තොරතුරු මත පදනම්ව, 2016 මාර්තු 31 දිනට මුළු වත්කම් වන්නේ,

(1) රු. 305,000/- කි.
(2) රු. 545,000/- කි.
(3) රු. 345,000/- කි.
(4) රු. 225,000/- කි. **(AAT - January 2017)**

12. 2015 මාර්තු 31 දිනට සහ 2014 මාර්තු 31 දිනට ලසන්තගේ ව්‍යාපාරයේ ශුද්ධ වත්කම්, පිළිවෙලින්, රු. 1,350,000/- ක් සහ රු. 1,000,000/- ක් විය. වර්ෂය තුලදී ලසන්ත රු. 500,000/- ක අතිරේක ප්‍රාග්ධනයක් යෙදවීය. එසේම ඔහුගේ ව්‍යාපාරයෙන් ගැනිලි වශයෙන් රු. 600,000/-ක් ඔහු ලබාගෙන තිබුණි. ඒ අනුව 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලසන්ත විසින් උපයන ලද ලාභය වන්නේ,

(1) රු. 250,000/-
(2) රු. 350,000/-
(3) රු. 450,000/-
(4) රු. 950,000/- **(AAT - July 2015)**

13. XY ට්‍රේඩර්ස්හි පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු. |
|---|---:|
| 2013 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 500,000 |
| වර්ෂය තුළ ගැනිලි | 150,000 |
| 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 450,000 |
| 2014 මාර්තු 31 දිනට වගකීම් | 200,000 |

ඉහත තොරතුරු වලට අනුව, 2014 මාර්තු 31 දිනට මුළු වත්කම් වන්නේ:

(1) රු. 700,000/-

(2) රු. 1,000,000/-

(3) රු. 1,100,000/-

(4) රු. 1,300,000/- **(AAT - January 2015)**